2021

වාර්ෂික වාර්තාව

வருடாந்த அறிக்கை

ANNUAL REPORT

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
இலங்கை புத்தாக்குனர் ஆணைக்குழு
SRI LANKA INVENTORS COMMISSION

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය
திறன்கள் அபிவிருத்தி, தொழில்நுட்பக் கல்வி, ஆராய்ச்சி மற்றும் புத்தாக்க அமைச்சு
State Ministry of Skills Development, Vocational Education, Research & Innovation

46-48, Cotta Road, Colombo 08
Tel: 011-2676650, Fax: 011-2676646
Website: www.slic.gov.lk, Mail: info@slic.gov.lk

වාර්ෂික වාර්තාව - 2021

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

(නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන,
පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය)

නො.46 - 48, කොටා පාර

කොළඹ 08

පටුන

පිටුව

කොමිසමෙහි සාමාජිකයින් 3

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින් 3

කොමසාරිස්තුමාගේ පණිවිඩය 4-5

1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 6

1.1 හැඳින්වීම 6

1.2 දැක්ම 6

1.3 මෙහෙවර 6

1.4 පරමාර්ථ 6

1.5 කොමිසමේ බලතල, කර්තව්‍යය හා කාර්යයන් 7

1.6 ආයතනික සැලැස්ම 8

1.7 මානව සම්පත් 9

2. 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන් 10

2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් යා කරන, “සහසක් නිමැවුම් 2021” අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය 10-11

2.2 පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසාර පරිසර හිතකාමී විදුලි උත්පාදන ක්‍රමවේදය හඳුනාගැනීම 11

2.3 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය 11-12

2.4 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන ‘‘නව නිපැයුම් දිරිය’’ 12-13

2.5 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers) 13

2.6 වාණිජකරණ ක්‍රියාන්විතයේ දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය ගොඩනැංවීම 14-15

2.7 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම 16-17

2.8 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නව නිපැයුම්කරුවන්ට සහාය 17-18

2.9 කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් 18-21

2.10 පර්යේෂණයන් එළිදැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සමුළුව(“From Innovation to Impact ”– FITI 2021) 22

2.11 Idea Incubator (අදහස් උත්පාදක මැදිරිය) 23

2.12 නව නිපැයුම්කරුවන්ට විශේෂිත සේවාවන් ලබාදීම 23

2.13 නව නිපැයුම්කරුවන්ගේ හමුව 23

2.14 අන්තර්ජාතික පිළිගැනීම 23-24

2.15 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය 24

2.16 නව නිපැයුම් ප්‍රචලිත කිරීම 24

2.17 මාධ්‍ය මෙහෙවර 25

2.18 මානව සම්පත් සංවර්ධනය 25-26

3. මූල්‍ය ප්‍රකාශනය 27-54

කොමිසමෙහි සාමාජිකයින්

මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු මහතා (2021.07.27 සිට – 2021.12.31 දක්වා)
කොමසාරිස්

මහාචාර්ය රංගික උමේෂ් හල්වතුර මහතා (2021.01.01 – 2021.07.26)
කොමසාරිස්

මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය (2021.01.01 සිට - 2021.12.31 දක්වා)
සහකාර කොමසාරිස්

වෛද්‍ය ආර්. එම්. එච්. එම්. අනුපප ඉන්දික හේරත් මහතා (2021.04.08 සිට - 2021.12.31 දක්වා)
සහකාර කොමසාරිස්

ඒ. පී. එස්. එල්. විජේසිංහ මහතා (2021.01.01- 2021.04.07)
සහකාර කොමසාරිස්

පී. වී. බී. පී. සිසිර නන්දන මහතා (2021.01.01.- 2021.12.31)
භාණ්ඩාගාර නියෝජිත

විගණන හා කළමනාකරණ කමිටු සාමාජිකයින්

පී. වී. බී. පී. සිසිර නන්දන මහතා (2021.01.01.- 2021.12.31)
භාණ්ඩාගාර නියෝජිත

මහාචාර්ය නීලිකා මලවිගේ මහත්මිය (2021.01.01- 2021.12.31)
සහකාර කොමසාරිස්

වෛද්‍ය ආර්. එම්. එච්. එම්. අනුපප ඉන්දික හේරත් මහතා (2021.04.08- 2021.12.31)
සහකාර කොමසාරිස්

ඒ. පී. එස්. එල්. විජේසිංහ මහතා (2021.01.01- 2021.04.07)
සහකාර කොමසාරිස්

එච්. ඩී. අනුරුද්ධිකා මහත්මිය (2021.01.01- 2021.12.31)
අභ්‍යන්තර විගණක

නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය

එච්. එම්. යූ. එස්. ඒ. විජේකෝන් මහතා (2021.05.01- 2021.12.31)
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත

ඩබ්. පී. එල්. එස්. ආර්. පෙරේරා මහත්මිය (2021.01.01- 2021.12.31)
විගණකාධිපති දෙපාර්තමේන්තු නියෝජිත

කොමසාරිස්තුමාගේ පණිවිඩය



ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ කොමසාරිස්
මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ බලාත්මක කිරීමේ මූලික පරමාර්ථය වන්නේ දේශීය නවෝත්පාදනය දිරිගන්වමින්, නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික, මූල්‍ය හා නීතිමය සහයෝගය ලබාදීමයි.

මෙම පරමාර්ථය මුදුන් පමුණුවා ගැනීම උදෙසා යන ගමනේ දී මුහුණ පෑමට සිදුවන අභියෝග බොහොමයක් ඇති අතර, ඒවාට විසඳුම් සෙවීම පමණක් නොව සාර්ථක අයුරින් ජය ගැනීම නිසාවෙන් නව නිපැයුම්කරුවාට පමණක් නොව සමස්ථ සමාජයටම ඇති වන සුබවාදී බලපෑම අති මහත් ය. ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් බිහි කිරීම තුලින් රටේ ජනතාව ගේ නිර්මාණශීලීත්වය වැඩිදියුණු වනවා මෙන්ම දේශීය ආර්ථිකය නඟා සිටුවීමට එය ප්‍රබල පිටුවහලක් ද වේ.

මෙම අදහස්, අපේක්ෂාවන් හා පරමාර්ථයන් මුදුන්පමුණුවා ගැනීම වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම නිරන්තරයෙන් සැදී පැහැදී සිටිමින් ඉලක්කගත විශේෂිත වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි. නවෝත්පාදන පිළිබඳව කැමැත්තක් ඉල්ලුමක් ඇතිවනුයේ ඒවා සමාජය තුල ප්‍රචලිත වන තරමට ය. එබැවින් නිසි ප්‍රචාරණයක් ලබාදීම තුලින් නව නිපැයුම් සමාජගත කිරීම අනිවාර්ය අවශ්‍යතාවයකි. මෙම අරමුණ යථාර්ථයක් බවට පත් කෙරෙන වැඩසටහන් රාශියක් කොමිසම විසින් ක්‍රියාත්මක කරන අතර, ඒ අතරින් ‘‘සහසක් නිමැවුම්’’ සඳහා හිමිවන්නේ විශේෂිත ස්ථානයකි. 2012 වසරේදී ප්‍රථම වරට ක්‍රියාත්මක කරන ලද එම ජාතික ප්‍රදර්ශනය 2020 වසරේ සිට අන්තර්ජාතික මට්ටමේ නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනයක් ලෙසින් ඉතිහාසගත වෙමින් ක්‍රියාත්මක කරන ලදී. ‘‘සහසක් නිමැවුම්’’ යනු මෙරටදීම විදෙස් නව නිපැයුම් තරඟ අත්දැකීම ලබාගැනීම සඳහා ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ට උදා වන මාහැඟි අවස්ථාවක් වේ.

කොමිසම පිහිටුවීමේ පනත ප්‍රකාරව නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික හා මූල්‍යමය සහාය ලබාදීම වෙනුවෙන් වාණිජකරණ විභවයක් සහිත නව නිපැයුම් වෙළෙඳ පොළ වෙත ගෙන යෑම පාදක කරගනිමින් “IAFM-SL” (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) හා ‘‘නව නිපැයුම් දිරිය’’ නමින් ව්‍යාපෘති ද්විත්වයක් හඳුන්වා දී ඇත. මෙහිදී විශේෂඥ විනිසුරුවන් ගේ ඇගයීම් අනුව හඳුනාගත් යෝග්‍ය වූ නිපැයුම් වෙනුවෙන් මූල්‍ය හා තාක්ෂණික සහයෝගය ලබාදීම සිදුකරනු ලබයි.

එමෙන්ම ජාතික නවෝත්පාදන බීජෞෂණ මධ්‍යස්ථාන පිහිටුවීම මගින් දේශීය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබාදීමට ද ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම පියවර ගෙන තිබේ. මෙයට අමතරව නිපැයුම්කරුවන්ගේ පර්යේෂණ අවශ්‍යතා වෙනුවෙන් සෙසු ආයතන වෙත යොමු කිරීමට කටයුතු යොදා තිබීම ද නව නිපැයුම්කරුවන්ට ඵලදායක ලෙස බලපා ඇති බව ද පැහැදිලි කරුණකි.

තව ද නව නිපැයුම් වල සුරක්ෂිතතාවය තහවුරු කර ගැනීම සඳහා බුද්ධිමය දේපළ අයිතිය (පේටන්ට්) ලබාගැනීම පිළිබඳව නව නිපැයුම්කරුවන්ට මාර්ගෝපදේශකත්වය ලබාදීමේ විශේෂිත වැඩපිළිවෙලක් ද කොමිසම විසින් ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම විද්‍යුත් හා මුද්‍රිත මාධ්‍ය හරහා නවෝත්පාදනය සමාජගත කිරීමට ද වැඩපිළිවෙලක් සකසා තිබේ. ඒ අනුව “Sri Lanka Inventors” නමින් YouTube දොරටුවක් හඳුන්වා දෙමින්, ව්‍යාපාරික අවස්ථා සහිත නව නිපැයුම් පිළිබඳව දෙස් විදෙස් ව්‍යවසායකයින් දැනුවත් කිරීමට අවකාශ සලසා තිබේ. නවෝත්පාදන විෂයය කෙරෙහි කැමැත්තක් දක්වන ඕනෑම අයෙකුට එය ඉතාම ආකර්ෂනීය ප්‍රවේශයක් වේ. කොමිසමේ නිල වෙබ් පිටුව ද නවෝත්පාදන ප්‍රවර්ධනය කිරීමෙහි ලා වැදගත් කාර්යභාරයන් රැසක් ඉටු කරන අතර, මේ වන විට එය නවෝත්පාදකයන් හා ආයෝජකයින් අතර සම්බන්ධතාවයක් ගොඩනඟාලිය හැකි ආකාරයෙන් සංස්කරණය කර තිබේ.

මේ හැරුණු කොට නව නිපැයුම්කරුවන්ගේ ශක්‍යතා වර්ධනය වෙනුවෙන් වැඩසටහන් සංවිධානය කිරීම, සෑම වසරකම ඔක්තෝබර් මස 26 දිනට යෙදෙන ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය සැමරීම, නව නිපැයුම්කරුවන් වෙනුවෙන් හැඳුනුම්පත් නිකුත් කිරීම, නව නිපැයුම්කරුවන් මුහුණ පාන ගැටළු පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා ‘‘නව

නිපැයුම්කරුවන්ගේ හමුව'' නමින් විශේෂිත වැඩසටහනක් පැවැත්වීම, නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම ආදී වශයෙන් සුවිශේෂී කාර්යභාරයන් රැසක් ඉටු කිරීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලැබී තිබේ.

මෙම සෑම කාර්යයක් වෙනුවෙන්ම පාලක මණ්ඩල මඟ පෙන්වීම මත කොමිසම සතුව ඇති ඉතාමත් සීමිත වූ කාර්යමණ්ඩලයේ දායකත්වය උපරිමව හිමි වන අතර, වැඩසටහන් වල සාර්ථකත්වය සඳහා එය ප්‍රබල සාධකයක් බවට පත්ව තිබේ.

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ හෙට දවස උදෙසා අපරිමිත සේවයක් ඉටු කළ, ඉටු කරන්නා වූ සියළු දෙනා වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ස්තුතිය පිරිනමන අතර, ඉදිරියේදී ද ලාංකේය අනන්‍යතාවය ලෝකයේම පැසසුමට ලක් කරන්නා වූ නව නිපැයුම් බිහි කරමින් රට තුල නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවලිත කිරීමට දේශීය නව නිපැයුම්කරුවන්ට අවස්ථාව සැලසේවා ! යි සුභාශිංසන පිරිනමමි.

1. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

1.1 හැඳින්වීම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් දිරිගැන්වීම, ප්‍රවර්ධනය සහ නිෂ්පාදනය දිරි ගැන්වීමත්, ඒවාට සම්බන්ධ අනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීමත් වෙනුවෙන් 1979 අංක 53 දරන ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනත යටතේ පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.

1.2 දැක්ම

''නව නිපැයුම් මවන දැයක් - යස ඉසුරින් පිරුණු හෙටක්''
(නව නිපැයුම් හා නවෝත්පාදන තුලින් සෞභාග්‍යය උදා කිරීම)

1.3 මෙහෙවර

ශ්‍රී ලාංකිකයින්ගේ නවෝත්පාදන හැකියාවන් ප්‍රවර්ධනය කරවීම ප්‍රධාන උත්ප්‍රේරකය ලෙස ක්‍රියා කරමින්, අදහස් ප්‍රායෝගික යෙදවුම් බවට පරිවර්තනය කිරීමේ ක්‍රියාවලිය සඳහා පහසුකම් සැලසීමේ පුරෝගාමියා ලෙස කටයුතු කිරීම.

1.4 පරමාර්ථ

1.4.1 ශ්‍රී ලංකාවේ පුරවැසියන් විසින් නව නිපැයුම් කරනු ලැබීම හෝ නිර්මාණය කරනු ලැබීම වෙනුවෙන් ඔවුනට ධෛර්යය දීම.

1.4.2 නව නිපැයුම්කරුවනට තාක්ෂණික, මූල්‍ය හා නීති ආධාර ලබා දීම.

1.4.3 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ පනතේ සඳහන් සියලු බලතල, කර්තව්‍යය හා කාර්ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම.

1.4.4 ඉහත දක්වා ඇති පරමාර්ථ මුදුන්පත් කිරීම සඳහා අවශ්‍ය වන හෝ උපකාරී වන වෙනත් සියලු කටයුතු කිරීම.

1.5 කොමිසමේ බලතල, කර්තව්‍යය හා කාර්යයන්

(අ) කොමිසමේ නියමයන්ට හා කොන්දේසීන්ට යටත්ව, නව නිපැයුම් සඳහා පේටන්ට් බලපත්‍ර අයදුම් කිරීමේදී අදාල කරුණු පරීක්ෂා කර බලා ඒ ඒ නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය තාක්ෂණික ආධාර ලබාදීම සහ පේටන්ට් අයදුම් පත පිළියෙල කිරීම වෙනුවෙන් උපකාර කිරීම.

(ආ) පේටන්ට් බලපත්‍ර නිකුත් කර ඇති නව නිපැයුම් හෝ පේටන්ට් අපේක්ෂිත නව නිපැයුම් වැඩි දියුණු කිරීම, පරිපූර්ණ කිරීම හා නිෂ්පාදනය කිරීම සඳහා කොමිසමේ නියමයන්ට යටත්ව මුදල් ආධාර ලබා දීම.

(ඇ) නව නිපැයුම්කරුවන්ගේ පේටන්ට් බලපත්‍ර දේශීයව හෝ විදේශීයව ඉදිරිපත් කිරීමේ දී ඔවුන් නියෝජනය කිරීමෙන් සහ පේටන්ට් අයිතීන් උල්ලංඝනය කිරීම්වලදී මෙන්ම පේටන්ට් අයිතිය පිළිබඳ නඩු වල දී ඔවුන් ආරක්ෂා කිරීම සඳහා නීති ආධාර දීම.

(ඈ) නව නිපැයුම්වල ගුණාත්මකභාවය මත පදනම්ව එම පේටන්ට් අයිතීන් පමණක් ඇපයට තබාගනිමින් රාජ්‍ය ණය දෙන ආයතන වෙතින් නව නිපැයුම්කරුවනට දීර්ඝ කාලීන ණය ලබාගැනීමට හැකි වන පරිදි නිර්දේශයන් ඉදිරිපත් කිරීම. නව නිපැයුමෙහි වැදගත්කම සහ අලෙවිය පිළිබඳව කොමිසම විසින් දෙනු ලබන තීරණය මත රඳා පවතිමින් ණය මුදලේ ප්‍රමාණය නිර්ණය කරනු ලැබේ.

(ඉ) දේශීය නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවනට උපකාර කිරීම.

(ඊ) කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව, ජාතික ආරක්ෂාව, ඖෂධවේදය, භෞතික විද්‍යාව, මහජන ආරක්ෂාව හා සුභ සාධනය, පොදු කර්මාන්ත, ප්‍රවාහනය යන ක්ෂේත්‍ර වල සහ වෙනත් එවැනි විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍ර වල එක් එක් වර්ෂයන් හි ශ්‍රී ලංකාවේ දී පේටන්ට් බලපත්‍ර දෙන ලද සියළු ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් සඳහා වාර්ෂිකව ජනාධිපති සම්මාන පිරිනැමීම හරහා දේශීය නව නිපැයුම් ප්‍රකට කිරීම වෙනුවෙන් ඔවුන් ඇගයීම හා ධෛර්ය දීම.

(උ) බලය දෙන ලද නව නිපැයුම්කරුවනට සහ පර්යේෂකයන්ට ස්වකීය අනුමත කළ නව නිපැයුම් සහ පර්යේෂණ කරගෙන යාම සඳහා හෝ ඒවා පරිපූර්ණ කිරීම සඳහා පර්යේෂණ රසායනාගාර හෝ අත්හදා බැලීමේ මධ්‍යස්ථාන පහසුකම් හා සේවා ලබා ගත හැකි වන පරිදි පොදු පර්යේෂණ රසායනාගාරයක් සහ අත්හදා බැලීම් මධ්‍යස්ථානයක් පිහිටුවීම හා පවත්වාගෙන යාම.

(ඌ) ‘‘නව නිපැයුම් පිළිබඳ ජනාධිපති ප්‍රදාන’’ තරඟවල ඒ ඒ විනිශ්චයකරුවන් විසින් තෝරාගනු ලබන ජයග්‍රහකයන්ට මුදල් ත්‍යාග හා පදක්කම් පිරිනැමෙන ‘‘නිර්මාණාත්මක පර්යේෂණ තරඟයක්’’ වාර්ෂිකව පැවැත්වීමෙන් ශ්‍රී ලංකාවේ ජනතාව අතර නව නිපැයුම් කිරීම, නිර්මාණශීලීත්වය වැඩි දියුණු කිරීම, ඊට ධෛර්ය දීම සහ කෘෂිකර්මය, රසායන විද්‍යාව, වෛද්‍ය විද්‍යාව ආදී වූ විද්‍යාත්මක හා තාක්ෂණ විද්‍යාත්මක ක්ෂේත්‍රවල නව නිපැයුම් නිර්මිත කිරීමට ඔවුන්ට සහාය දීම.


(එ) නව නිපැයුම් සහ පර්යේෂණ පිළිබඳවත් පොදුවේ විද්‍යාව පිළිබඳවත් තොරතුරු පළකිරීම සහ පතළ කර හැරීම.

(ඒ) නව නිපැයුම්කරුවන් අතර අදහස් හුවමාරු කරගැනීම සඳහා මාසික රැස්වීම් නිතිපතා පැවැත්වීම.

(ඔ) නව නිපැයුම් සහ පර්යේෂණ සඳහා පැවැත්වෙන අන්තර්ජාතික තරඟවලට සහභාගීවීමට ශ්‍රී ලාංකීක නව නිපැයුම්කරුවන්ට උපකාරීවීම හෝ එවැනි තරඟවලට ඔවුන් නිර්දේශ කිරීම.

(ඕ) ශ්‍රී ලාංකික යෞවනයන් අතර නිර්මාණශීලීත්වය වැඩිදියුණු කිරීම සහ ඊට ධෛර්යදීම සඳහා පාසල්වල, විශ්වවිද්‍යාල වල නිර්මාණාත්මක සමිති සංවිධානය කිරීම.

1.6 ආයතනික සැලැස්ම



1.7 මානව සම්පත

තනතුර	අනුමත කාර්ය මණ්ඩලය	2021 වර්ෂයේ කාර්ය මණ්ඩලය	2021 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු සංඛ්‍යාව
අධ්‍යක්ෂ (ප්‍රධාන විධායක නිලධාරි)	01	01	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ/ සහකාර අධ්‍යක්ෂ	02	02	-
නියෝජ්‍ය අධ්‍යක්ෂ / සහකාර අධ්‍යක්ෂ (මූල්‍ය)	01	01	-
නීති නිලධාරි	01	-	01
වැඩසටහන් නිලධාරි	03	03	-
පරිපාලන නිලධාරි	01	01	-
මූල්‍ය නිලධාරි	01	01	-
පර්යේෂණ සහකාර	05	03	02
කළමනාකරණ සහකාර	07	07	-
රියදුරු	04	04	-
කාර්යාල සහායක	02	02	-

2. 2021 වර්ෂයේ දී ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන ව්‍යාපෘති සහ වැඩසටහන්

2.1 ජාත්‍යන්තරය හා ශ්‍රී ලංකාව නවෝත්පාදනයෙන් යා කරන, "සහසක් නිමැවුම් 2021" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය

"සහසක් නිමැවුම්" අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලිය සංවිධානය කරන ලද්දේ නව නිපැයුම්කරුවන්ට තම නව නිපැයුම් ජාත්‍යන්තර මට්ටමින් ඉදිරිපත් කිරීමට අවස්ථාව සලසා දීම, ආයෝජක ප්‍රජාව හා සම්බන්ධ වෙමින් නව නිපැයුම් වාණිජකරණ මට්ටම දක්වා රැගෙන යාම, දැනුම හා තාක්ෂණය සෙසු නිර්මාණකරුවන් සමඟ හුවමාරු කර ගැනීම, ජයග්‍රහණ සඳහා නිසි ඇගයීමක් ලබා දීම, තෝරාගත් ජයග්‍රාහී නව නිපැයුම් සඳහා ජාත්‍යන්තර ප්‍රදර්ශන සහ තරඟ සඳහා සහභාගී වීමට අවස්ථාව සලසා දීම යනා දි වූ විවිධ ප්‍රතිලාභ නව නිපැයුම්කරුවන් වෙත ලබාදීමේ අරමුණ ඇතිව ය.



දේශීය තරඟ අංශය නියෝජනය කරමින් පාසල්, විශ්වවිද්‍යාල හා තෘතියික අධ්‍යාපන ආයතන, වාණිජකරණ හා විවෘත යන ප්‍රධාන අංශ 04ක් යටතේ පහත දක්වා ඇති තාක්ෂණික ක්ෂේත්‍ර දාහතරට (14) අදාළ වන පරිදි තරඟ සඳහා ඉදිරිපත් වීමට ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවනට අවස්ථාව සැලසේ.

- මහජන ආරක්ෂාව, සුභසාධනය හා ජාතික ආරක්ෂාව
- රසායන විද්‍යාව
- ආහාර තාක්ෂණය
- වෛද්‍ය විද්‍යාව හා ඖෂධවේදය
- සාම්ප්‍රදායික වෛද්‍ය විද්‍යාව
- පොදු කර්මාන්ත හා යටිතල පහසුකම්
- භෞතික විද්‍යාව
- කෘෂිකර්මය
- ව්‍යවහාරික විද්‍යා සහ තාක්ෂණය
- බලශක්තිය
- පරිසර සංරක්ෂණය
- ඉංජිනේරු
- තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය
- ප්‍රවාහනය

මෙම එක් එක් තාක්ෂණික ක්ෂේත්‍රය යටතේ ජයග්‍රාහකයින් තෝරා ගනු ලබන අතර, එම නව නිපැයුම් සුදුසුකම් ලත් දේශීය සහ ජාත්‍යන්තර විනිශ්චය මණ්ඩලයක් වෙතින් ඇගයීමට ලක් කෙරේ.

රට තුල උද්ගත වූ COVID-19 වසංගත තත්ත්වය හමුවේ වුව ද කොමිසම විසින් සිය වැඩසටහන් අකර්මණ්‍ය නොවී පවත්වාගෙන යනු ලැබූ අතර, ඒ සඳහා ප්‍රායෝගික තාක්ෂණික ක්‍රමවේදයන් භාවිතා කරන ලදී. 2019 වසර දක්වා පළාත් මට්ටමේ දැනුවත් කිරීම් ඔස්සේ දිවයින පුරා විසිරී සිටින නිර්මාණශීලී ප්‍රජාව ඒකරාශී කරගනිමින් පැවැත්වූ 'සහසක් නිමැවුම්' ප්‍රදර්ශනය හා තරඟාවලිය, 2020 වර්ෂයේ දී මෙන්ම 2021 වසරේ දී ද අන්තර්ජාල තාක්ෂණය ඔස්සේ මාර්ගගත තරඟාවලියක් (Online Competition) ලෙස ක්‍රියාත්මක කරනු ලැබී ය.

"සහසක් නිමැවුම් 2021" සඳහා දේශීය නව නිපැයුම් 268 ක් හා විදෙස් නව නිපැයුම් 12ක් වශයෙන් අයදුම්පත් ඉදිරිපත් කර තිබුණි. තරඟයේ සමස්ත අයදුම්පත් ඇගයීම සඳහා විශේෂඥ විනිසුරු මඩුල්ලක් සම්බන්ධ වී සිටි අතර, ජාතික තරඟ අංශයේ ඇගයීම් අතරින් රන් පදක්කම් 20 ක්, රිදී පදක්කම් 29 ක් සහ ලෝකඩ පදක්කම් 27 ක් වශයෙන් ජයග්‍රහණ ප්‍රකාශයට පත් කර තිබේ.

විදෙස් තරඟ අංශයේ ඇගයීම් අතරින් රන් පදක්කම් 7 ක් සහ රිදී පදක්කම් 5 ක් වශයෙන් ජයග්‍රහණ ප්‍රකාශයට පත් කර තිබේ. දෙස් විදෙස් ජයග්‍රාහකයන්ට හිමි පදක්කම් සහ සහතික පත්‍ර ඔවුන්ගේ නිවෙස් වෙතටම ලබා දීමට ද කටයුතු සූදානම් කර ඇත.

සහසක් නිමැවුම් 2021 අන්තර්ජාතික නව නිපැයුම් හා නවෝත්පාදන ප්‍රදර්ශනය සහ තරඟාවලියේ දේශීය තරඟාවලියෙන් රු. 250,300 ක් හා අන්තර්ජාතික තරඟාවලියෙන් ඇ.ඩො. 1384 ක් වශයෙන් මුදල් උපයා ගැනීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට හැකියාව ලැබුණි.

2021 ජාතික විද්‍යා සතිය සැමරීමට සමගාමීව 2020 සහසක් නිමැවුම් තරඟාවලියේ ප්‍රධාන අංශ 04 සඳහා "දසිස්" සම්මාන පිරිනැමීම ද මෙම වසරේ දී සිදු කරන ලදී.

"සහසක් නිමැවුම් 2021" යනු නව නිපැයුම්කරුවන්ට සිය නව නිපැයුම් ඉදිරිපත් කිරීමට ගොඩනංවන ලද ජාත්‍යන්තර වේදිකාවක් වන අතරම, අනාගත අභියෝගයන්ට මුහුණ දෙමින් එදිනෙදා ජීවිතයේ සුව පහසුව ළඟා කර දිය හැකි තාක්ෂණික මෙවලම් වැඩිදියුණු කිරීම් ඔස්සේ විශිෂ්ට ශ්‍රී ලංකාවක් ගොඩනැංවීම සඳහා වන ප්‍රධාන ප්‍රවේශ මාර්ගයක් ලෙස ද හැඳින්විය හැකි ය.

2.2 පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසාර පරිසර හිතකාමී විදුලි උත්පාදන ක්‍රමවේදය හඳුනාගැනීම

පුනර්ජනනීය බලශක්තිය ආශ්‍රිත තිරසාර පරිසර හිතකාමී විදුලි උත්පාදනය වෙනුවෙන් මෙන්ම බලශක්ති අර්බුදයට නව නිපැයුම් තුලින් විසඳුම් සෙවීමට ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් මූලාරම්භය ගෙන තිබේ. මේ සඳහා බලශක්ති අමාත්‍යාංශය, සුනිත්‍ය බලශක්ති අධිකාරිය හා ලංකා විදුලිබල මණ්ඩලය, විශ්වවිද්‍යාල මෙන්ම දේශීය නවෝත්පාදකයන්ගේ දායකත්වය ද හිමි වී තිබේ.

වර්තමානයේ රටෙහි විදුලි අවශ්‍යතාවය වාර්ෂිකව ගිගා වොට් පැය 14150 ක් වන අතර, එයින් 51.65% ක ප්‍රමාණයක් ලැබෙනුයේ පුනර්ජනනීය නොවන මූලාශ්‍රයන් වෙතිනි. පොසිල ඉන්ධන දහනය ගෝලීය උණුසුම තීව්‍ර කිරීමට හේතු වන අතරම මේවායෙහි ස්වභාවිකව පවත්නා සීමිත බව හේතුවෙන් මිල ද දිනෙන් දින ඉහළ යමින් පවතී. එබැවින් මෙම යෝජිත විදුලි උත්පාදන ක්‍රමවේදය ආකාර කිහිපයකින් රටට වාසි සහගත වේ. මෙම පද්ධතිය ස්ථාපිත කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ වියදම අවම වන අතර, විදුලි උත්පාදනය සඳහා වැය වන මුදල ද අවම වේ. එමෙන්ම වෙනත් බලාගාරවල මෙන් මහා පරිමාණ වේලි වැනි ඉදිකිරීම් නොමැති වීම ද වාසි සහගත ය. නිදසුනක් වශයෙන් මුහුදු රළෙහි විභව ශක්තිය වායු ප්‍රවාහයකට පරිවර්තනය කරමින් ඒ හරහා ටර්බයින භ්‍රමණය කරවීමේ වඩාත් කාර්යක්ෂම බලශක්ති උත්පාදන ක්‍රමවේදයක් භාවිතා කිරීම සිදුවේ. එබැවින් මෙම යෝජිත ව්‍යාපෘතිය වඩා කාර්යක්ෂම, විශ්වාසනීය, තිරසාර මෙන්ම පරිසර හිතකාමී බලශක්ති උත්පාදන ක්‍රියාවලියක් වනු ඇත.

මෙහිදී මූලික වශයෙන් නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ව්‍යාපෘති විද්වත් මණ්ඩලයක් මගින් ඇගයීමට ලක් කොට, තෝරාගැනෙන නව නිපැයුම් වල මූලාකෘති නිර්මාණය කිරීමට සහයෝගය ලබා දීම කොමිසමේ අපේක්ෂාවයි.

2.3 නව නිපැයුම් වාණිජකරණය සඳහා වන IAFM SL (Innovation Accelerator Funding Mechanism for Sri Lanka) ව්‍යාපෘතිය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වෙළෙඳ පොළ දක්වා ගෙන යාමට හා පර්යේෂණ සඳහා සහාය දක්වමින් ඒවා මුදල් බවට පරිවර්තනය කිරීමේ යාන්ත්‍රණය ක්‍රියාත්මක කිරීම වෙනුවෙන් IAFM-SL ව්‍යාපෘතිය රේඛීය අමාත්‍යාංශයේ අධීක්ෂණය

යටතේ කැබිනට් අනුමැතියක් මඟින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත පවරා ඇත. මෙය කොමිසමේ පනත මඟින් දක්වා ඇති නව නිපැයුම් වාණිජකරණය සඳහා සහාය ලබාදීම වෙනුවෙන් ක්‍රියාත්මක ය. නව නිපැයුමක් ලෙස බිහි වූ අවස්ථාවේ සිට වාණිජකරණය වූ නිමි භාණ්ඩයක් ලෙස සමාජ ගත වෙමින් නව නිපැයුම්කරුට පෞද්ගලිකව හා රටේ දේශීය ආදායමට දායකත්වය සැපයීම සඳහා පහසුකම් සැලසීම මෙම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වේ. මූල්‍යාධාර / ණය සඳහා අයදුම් කළ පසු අධීක්ෂණ කටයුතු පියවර ගණනාවක් යටතේ සිදු කරනු ලබයි.

2021 වර්ෂය සඳහා ඇගයීම් කටයුතු සිදු කිරීමට අවශ්‍ය විනිශ්චය මණ්ඩලය, ව්‍යාපෘතියේ මාර්ගෝපදේශ මාලාවට අනුව ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන ආයතනය, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව, ජාතික වාණිජ මණ්ඩලය, FCCISL, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය යනාදී ආයතන වෙතින් ලැබුණු නාම යෝජනා ආශ්‍රයෙන් 2021.01.20 පාලක මණ්ඩල අනුමැතියෙන් පත් කරන ලදී.

කොමිසම මඟින් ණය ලාභියාට ණය දෙන අවස්ථාවේදී අත්සන් කරන ගිවිසුමේ නෛතිකභාවය තහවුරු කර ගැනීම සඳහා කැබිනට් අමාත්‍යාංශයේ නීති නිලධාරී වෙත සහ නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන ලදී. ඒ අනුව නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලද ධනාත්මක ප්‍රතිචාරයන්ට අනුව ගිවිසුම වඩාත් නෛතික පිළිගැනීමක් ඇති කරවන පරිදි සකසා, නීති නිලධාරියෙකු ලවා 2022 වසර සඳහා නව ණය ලාභීන්ට ණය ලබා දීමේදී එම නව ගිවිසුම් ආකෘතිය භාවිතා කිරීමට අපේක්ෂිත ය.

මෙම වසරේදී රු. මිලියන 19.2 ක පමණ මුදලක් ලබා ගැනීම සඳහා ඉල්ලුම් කර තිබූ නව නිපැයුම් 07ක් සඳහා ඇගයීම් කටයුතු අවසන් කර ඇත.

තව ද ‘‘පොහොර සහ බීජ’’ නමැති නිපැයුමෙන් ඒකක 30 ක් නිෂ්පාදනය කිරීම සඳහා කෘෂිකර්ම අමාත්‍යාංශයට රුපියල් මිලියන 6.0 ක් වටිනා නිර්දේශිත ණය කොටස් 02 ක් නිකුත් කරන ලදී. තවත් මිලියන 6.8 ක ණය නිර්දේශ වී ඇති අතර රු.මිලියන 6.5 ක ණය අයදුම්පත් මූල්‍ය කමිටුවේ ඇගයීමට ලක් වෙමින් පවතී.

කොමිසම විසින් නිෂ්පාදන භාගය ලෙස ලබා ගන්නා 3%ක කොටස් ලෙස රුපියල් 23,803.00 සංචිතයක් 2021 වසර අවසාන වන විට ජනනය කර ඇත.

2.4 නව නිපැයුම් වාණිජමය පදනමක පිහිටුවීම උදෙසා වන ‘‘නව නිපැයුම් දිරිය’’



කොමිසම තුල ක්‍රියාත්මක නව නිපැයුම් වාණිජකරණයට ඇවැසි සහාය ලබාදීමේ අනෙක් වැඩසටහන ‘‘නව නිපැයුම් දිරිය’’ “INVENT Grant Scheme” නමින් ක්‍රියාත්මක කරනු ලබයි. වාණිජකරණය සඳහා වෙළෙඳපොළ විභවයක් සහිත නව නිපැයුම් විද්වත් ඇගයීම් මඩුල්ලක සහභාගීත්වයෙන් අධීක්ෂණය කරන ලදුව ක්ෂේත්‍ර පරීක්ෂාවකින් තහවුරු කර, එම නිරීක්ෂණ රේඛීය අමාත්‍යාංශයේ නියෝජිතත්වයෙන් යුතු මූල්‍ය කමිටුවට ලබාදෙයි. එහිදී ගනු ලබන තීරණ පාලක මණ්ඩලයේ අනුමැතියෙන් ක්‍රියාත්මක කරනු ලබයි.

නව නිපැයුම් දිරිය යටතේ ආධාර ලබා ගැනීම සඳහා වන මූලික සුදුසුකම් පහත අයුරු වේ.

1. ශ්‍රී ලාංකීය පුරවැසියෙකු වීම.
2. බුද්ධිමය දේපළ අයිතිය තහවුරු කරගෙන තිබීම හෝ ඒ සඳහා අයදුම් කර තිබීම.
3. ක්‍රියාත්මක මට්ටමේ ඇති මූලාකෘතියක් / නව නිපැයුම් ආකෘතියක් තිබීම.
4. නව නිපැයුම සඳහා ඉතා හොඳ වාණිජමය විභවයක් පැවතීම හෝ ප්‍රායෝගිකව සමාජයේ යහ පැවැත්ම සඳහා උපයෝගී කර ගත හැකි වීම.
5. දැනටමත් වාණිජකරණ මට්ටමේ නිෂ්පාදන ආරම්භ කර තිබීම හෝ ව්‍යාපාරික අවස්ථා සඳහා වන මූලික අවශ්‍යතාවන් සපුරා තිබීම.

මෙම ක්‍රමවේදය තුලදී නව නිපැයුම් සඳහා මූල්‍යාධාර ලබාදීම වෙනුවට, පොළී රහිතව ලබාදෙන ණය මුදල නැවත පියවීමට එකඟත්වය ඇති කර ගත් කාල සීමාව තුලදී නව නිපැයුම්කරු විසින් පියවිය යුතු වෙයි. ඇගයීම් කමිටුවේ නිර්දේශ මත නව නිපැයුම වෙළෙඳපොළට ගෙන ඒම හෝ ව්‍යාප්තිය වැඩි කිරීම සඳහා පොළී රහිත ණය ලබාදීම සිදු කරයි.

එලෙස 2021 වර්ෂයේ දී නව නිපැයුම් දිරිය වැඩසටහන යටතේ අයදුම්පත් 13 ක් ලැබී තිබූ අතර ඒවා සියල්ලේම ඇගයීම් කටයුතු අවසන් කර ඇත.

තාක්ෂණික ඇගයීමෙන් සමත්ව ඉදිරි කටයුතු සඳහා නව නිපැයුම් 4 ක් වෙනුවෙන් ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කර ඇති අතර මීට පෙර ක්ෂේත්‍ර පරීක්ෂණ සිදු කළ ව්‍යාපෘතීන් මූල්‍ය ඇගයීමට ලක් කිරීම සඳහා මූල්‍ය කමිටු රැස්වීම් 5 ක් පවත්වා ඇත. සම්පූර්ණ ඇගයීම් ක්‍රියාවලිය අවසන්ව නිර්දේශ වූ බීජ වියලනය වෙනුවෙන් නිෂ්පාදිත නව නිපැයුමක් වාණිජකරණය සඳහා නව නිපැයුම්කරුවකු වෙත රු. 500,000 ක් ණය වශයෙන් ලබා දී ඇත. තව ද ආයතන 60 ක් පමණ ණය ලබා දීම ආදී සේවා පිළිබඳව දැනුවත් කර ඇත.

වාණිජකරණ ක්‍රියාවලියේදී 3%ක් වශයෙන් ලබා ගන්නා නිෂ්පාදන භාගය ලෙස රු. 58,177.39 ක සංචිතයක් 2021 වසර අවසාන වන විට ලැබී ඇත. පසුගිය වසර 10ක පේටන්ට් නිකුත් කර ඇති නව නිපැයුම්කරුවන්ගේ දත්ත එක් රැස් කිරීමේ වැඩසටහන අනුව වසර 5 ක දත්ත එක් රැස් කර ඇත.

2.5 නව නිපැයුම්කරුවන්ට තාක්ෂණික සහයෝගය ලබාදීම වෙනුවෙන් ස්ථාපිත තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන (Technology Incubation Centers)

ශ්‍රී ලාංකික නව නිපැයුම්කරුවන්ගේ නිපැයුම් වාණිජකරණය සඳහා වූ මාර්ගය සකස් කිරීම වෙනුවෙන් එම නිපැයුම් වැඩි දියුණු කිරීම සඳහා තාක්ෂණික සහයෝගය ලබා දීමට මෙම තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන ස්ථාපිත කරන ලදී.

ඒ අනුව, ජාඇල ඒකල පිහිටි ජාතික ඉංජිනේරු පර්යේෂණ හා සංවර්ධන මධ්‍යස්ථානයෙහි (NERDC) සහ යාපනය විශ්වවිද්‍යාලයේ කිලිනොච්චි පරිශ්‍රයේ මේ වන විට තාක්ෂණික බීජෞෂණ මධ්‍යස්ථාන දෙකක් ස්ථාපිත කර ඇති අතර, 2021 වසරේදී රුහුණ විශ්වවිද්‍යාලයේ හා 2020 වසරේදී ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය තුල තවත් නව මධ්‍යස්ථාන 02 ක් ස්ථාපිත කරන ලදී. එම නව මධ්‍යස්ථාන දෙක සඳහා රේඛීය අමාත්‍යාංශය හා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් රුපියල් මිලියන 40 ක පමණ පිරිවැයක් දරමින් තාක්ෂණික උපකරණ පහසුකම් සලසා දී ඇත.









2.6 වාණිජකරණ ක්‍රියාන්විතයේ දේශීය සහ ජාත්‍යන්තර සහයෝගීතාවය ගොඩනැංවීම

- **තරුණ නව නිපැයුම්කරු - ව්‍යවසායක නායකත්වය සංවර්ධන වැඩසටහන**
  (Young Inventors – Entrepreneur Lead Development - YIELD)

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ Siemens Digital Industries මෘදුකාංග සමාගමේ දේශීය නියෝජිත PANACEA Solutions (Pvt) Ltd හි සහයෝගීතාවයෙන් YIELD වැඩසටහන ආරම්භ කරන ලදී.


මෙම වැඩසටහන පාසල් තරඟාවලියක් ලෙස ක්‍රියාත්මක වේ. Product Life Cycle Management (PLM) මෘදුකාංගය භාවිතයෙන් පාසල් සිසුන්ට තම නව නිපැයුම් හා නවෝත්පාදන සැලසුම් ඩිජිටල් පරිගණක ආධාරක නිර්මාණ බවට පත් කර ගැනීමට අවස්ථාව සැලසේ. එහිදී පාසල් සිසුන්හට නව තාක්ෂණය හා සම්බන්ධ පුහුණුවක්ද හිමි වේ.

ඒ අනුව, මෙම වැඩසටහන හා සම්බන්ධ වීමට කැමැත්තෙන් පසු වූ ත්‍රිමාණ සජීවීකරණය පිළිබඳ උනන්දුවක් දක්වන ශිෂ්‍ය නව නිපැයුම්කරුවන්ගෙන් අයදුම්පත් 696 ක් මේ වන විට ලැබී ඇත.





- **ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ BCS the Chartered Institute for IT Sri Lanka Section සහයෝගීතාවය**



රාජ්‍ය - පෞද්ගලික හවුල්කාරිත්වය පදනම් කර ගනිමින් තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය (ICT) හා සම්බන්ධ නවෝත්පාදන දිරිගැන්වීම සඳහා ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ BCS The Chartered Institute for IT Sri Lanka Section අතර සහයෝගීතාවයෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක වේ.

මෙය ජාතික ICT සම්මානය සඳහා ක්‍රියාත්මක වන අතර, දැනට NBQSA 2021 ට අදාළ මූලික කටයුතු ක්‍රියාත්මක කරමින් පවතී. ඒ අනුව, මේ සඳහා ඉදිරිපත් වන සියලුම නවෝත්පාදනයන් සුදුසුකම් ලත් ඇගයීම් මණ්ඩලයක් විසින් ඇගයීමට ලක් කෙරේ.

මෙහි ප්‍රධාන අරමුණු වන්නේ COVID-19 මෙන්ම ගංවතුර, සාගත සහ නියඟ වැනි ඕනෑම ස්වභාවික ව්‍යසනයක් හඳුනා ගැනීම, වැළැක්වීම, පාලනය කිරීම හෝ සහන සැලසීම සඳහා අවශ්‍ය නව්‍ය තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ පාදක නිෂ්පාදන හඳුනා ගැනීම හා ඕනෑම තොරතුරු සන්නිවේදන තාක්ෂණය ආශ්‍රිත නවෝත්පාදනයන් නිර්මාණය කිරීම සඳහා නව නිපැයුම්කරුවන් දිරිමත් කිරීමයි.

විවිධ තරඟ කාණ්ඩ යටතේ ජයග්‍රහණ ලබා ගත් ජයග්‍රාහකයින් ජාතික තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ සම්මාන උළෙල (NBQSA) හි සම්මානලාභීන් වන අතර, ඔවුන්ට ජාත්‍යන්තර තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ තරඟ සඳහා සහභාගීවීමට වැදගත් ප්‍රවේශයක් සකස් කර දෙනු ලැබේ.

- **ISC 2021 සමුළුව සඳහා IEEE EMBS Student Branch Chapter සමඟ කොමිසමේ උපායමාර්ගික හවුල්කාරිත්වය**

ශ්‍රී ලංකාවේ ජෛව වෛද්‍ය ඉංජිනේරු විද්‍යාවේ නවෝත්පාදන ප්‍රවර්ධනය වෙනුවෙන් ISC 2021 සමුළුව සඳහා උපාය මාර්ගික හවුල්කරුවෙකු වශයෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම මොරටුව විශ්වවිද්‍යාලයේ IEEE ඉංජිනේරු අංශයේ වෛද්‍ය සහ ජීව විද්‍යා ශිෂ්‍ය ශාඛාව සමඟ අත්වැල් බැඳගෙන ඇති අතර, ISC 2021 හි ප්‍රධාන පරමාර්ථය වනුයේ ශ්‍රී ලංකාවේ ජෛව, වෛද්‍ය, ඉංජිනේරු විද්‍යා ක්ෂේත්‍රයේ නව නිපැයුම් ප්‍රවලිත කිරීම සඳහා දායකත්වය ලබා දීමයි.

මෙම සමුළුව ජෛව, වෛද්‍ය, ඉංජිනේරු විද්‍යාව සම්බන්ධ ප්‍රධාන ක්ෂේත්‍ර කිහිපයක් ඉලක්ක කර ගනිමින් පවත්වනු ලබයි.

- **කෘෂිකර්මයට අදාළ නව නිපැයුම් ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සහයෝගයෙන් "කෘෂිකර්මයට අදාළ නව නිපැයුම් ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීම" සඳහා වූ ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. මෙමඟින් පරිසර හිතකාමී කාබනික / රසායනික පොහොර සහ කෘෂි රසායනික ද්‍රව්‍ය (කෘමි නාශක, වල්නාශක සහ හෝමෝන ප්‍රතිකාරක) වැනි දේශීය නිෂ්පාදන මෙන්ම කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා කෘෂිකාර්මික යන්ත්‍රෝපකරණ හඳුන්වාදීම, ලංකාව පුරා පවතින කෘෂි බිම්වල වන සත්ව හානි අවම කිරීම, පසු අස්වනු හානි අවම කිරීම හා අගය එකතු කළ දේශීය කෘෂිකාර්මික නිෂ්පාදන සහ කෘෂිකර්මාන්තය වැඩිදියුණු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ හා නව තාක්ෂණික යෙදවුම් භාවිතා කිරීම යන ක්ෂේත්‍ර වලට අදාල නව නිපැයුම් ඇගයීම සහ ප්‍රවර්ධනය කිරීම ද සිදුකරනු ලබයි.

- **කර්මාන්ත / පුද්ගල සහයෝගීතාව**

රජයේ අරමුදල් යාන්ත්‍රණය යන සංකල්පයෙන් ඔබ්බට රාජ්‍ය සහ පෞද්ගලික යන දෙඅංශයේම ආයතන සමඟ සහයෝගයෙන් නව නිපැයුම් සංවර්ධනය කිරීම සහ වාණිජකරණය කිරීම කෙරෙහි කොමිසමේ අවධානය යොමු වී ඇත. ඒ අනුව, මේ වන විට නව නිපැයුම් කිහිපයක් වාණිජකරණය කිරීම සඳහා ජාතික සංවර්ධන බැංකුව (NDB) සමඟ සාර්ථකව වැඩසටහනක් පවත්වා ගෙන යනු ලබයි.

බුද්ධිමය දේපළ අයිතිය සුරකිමින් රාජ්‍ය මුදල් භාවිතයෙන් තොරව පරිසර සංරක්ෂණය සහ පරිසර හිතකාමී කාණ්ඩයට අදාළ නව නිපැයුම් කිහිපයක් සඳහා සහයෝගය ලබා දීමට කොමිසමට හැකි විය. එහිදී නව නිපැයුම් 25 ක් සඳහා කොමිසම අවස්ථාව ලබා දුනි. කෙසේ වෙතත් එම අවස්ථාව ලබා ගැනීමට ඉදිරිපත් වූ නව නිපැයුම් එම නිපැයුම්කරුවන් ගේ ඉල්ලීම සහ ඉදිරිපත් වීම මත ජාතික සංවර්ධන බැංකුව (NDB PLC) වෙත යොමු කරන ලදී. ඔවුන් විසින් නව නිපැයුම් 08 ක් ඇගයීමට ලක් කර, එක් නව නිපැයුමක් සඳහා රු.300,000/- ක මූල්‍යාධාරයක් ලබා දීමට 2021 වර්ෂය තුළ ඉදිරිපත් විය. අනෙකුත් නව නිපැයුම් ද 2022 වසර තුළදී ඉදිරි කටයුතු සඳහා සලකා බැලීමට අපේක්ෂිත ය.

2.7 ශ්‍රී ලාංකේය නවෝත්පාදන සංස්කෘතියක ඉදිරි ගමන උදෙසා යොවුන් නව නිපැයුම් සමාජ පිහිටුවීම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නවෝත්පාදන වැඩිදියුණු කිරීම සඳහා පහසුකම් සැලසීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ පුරෝගාමියෙකු ලෙස කටයුතු කරන අතර, ශ්‍රී ලංකාව තුළ තරුණ නව නිපැයුම්කරුවන්ගේ සංස්කෘතියක් බිහි කිරීමේ දැවැන්ත වගකීමක් දරයි. ඒ අනුව, පාසල්, විශ්වවිද්‍යාල මෙන්ම තෘතියික අධ්‍යාපන ආයතනයන් හි සිසුන් අතර නවෝත්පාදන සංස්කෘතියක් නිර්මාණය කිරීම වෙනුවෙන් නව නිපැයුම් සමාජ ස්ථාපිත කිරීමේ වැඩසටහන ක්‍රියාවට නංවනු ලබයි.

කොමිසමේ මෙහෙයවීම යටතේ විවිධ පාර්ශවකරුවන්ගේ දායකත්වය මෙම කර්තව්‍යය වෙනුවෙන් ලබා ගැනීමට පියවර ගෙන ඇති අතර අධ්‍යාපන අමාත්‍යාංශය සමඟ එක්ව කොමිසම විසින් 2020 වර්ෂය වන විට දිවයිනේ කාර්මික විද්‍යාල තිස් නවයම (39) ඇතුලත් වන පරිදි යොවුන් නව නිපැයුම් සමාජ (Young Inventors Clubs) 270 කට අධික ප්‍රමාණයක් සාර්ථකව පිහිටුවීමට කටයුතු කර තිබුණි. 2021 වර්ෂයේ දී පළාත් නවයම ආවරණය වන පරිදි පාසල් යොවුන් නව නිපැයුම් සමාජ 450 ක් ස්ථාපනය කිරීමට කටයුතු කළ අතර එම සියලුම සමාජ සඳහා මූල්‍යාධාර ලෙස රු. 10,000.00 බැගින් ලබා දීමට නියමිත ය.

තව ද 2021 වසරේ දී මෙම වැඩසටහන සඳහා මූල්‍ය අනුග්‍රහය ලබා දීමට මහජන බැංකුව ඉදිරිපත් වී සිටින අතර, එම දායකත්වය රුපියල් මිලියන දෙකකි.

විශ්වවිද්‍යාල සිසුන්ගේ නව නිපැයුම් ප්‍රවර්ධනය කිරීම සඳහා විශ්වවිද්‍යාල පද්ධතිය තුළ නව නිපැයුම් සමාජ පිහිටුවීමේ නව වැඩපිළිවෙලක් ද මේ වන විට ආරම්භ කර ඇත.








යොවුන් නව නිපැයුම් සමාජ දිරිගන්වන "නිපැයුමාණි"


නව නිපැයුම් සමාජ තුල නව නිපැයුම් බිහි කිරීම සඳහා අවශ්‍ය නව තාක්ෂණයන් හා දැනුම බෙදා ගැනීම සඳහා මෙන්ම පාසල් මට්ටමේ ප්‍රාථමික අදහස් වෙළෙඳපොල ජයගත හැකි නිර්මාණ බවට පත් කිරීම සඳහා වන සම්පූර්ණ පහසුකම් සහිත වේදිකාවක් "Idea Incubator" නමින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ස්ථාපිත කරන ලදී.

රූපගත කිරීමේ පහසුකම් සහිත වේදිකාව හරහා දැනුම ප්‍රචලිත කිරීමේ වැඩසටහනක් "නිපැයුමාණි" නමින් හඳුන්වා දී ඇති අතර එම වේදිකාව මඟින් සිසුන්ට, නව නිපැයුම්කරුවන්ට සහ සම්පත් දායකයින්ට විවිධ ක්ෂේත්‍රයන්හි දැනුම හුවමාරු කර ගැනීමට අවස්ථාව ලැබේ.

Youtube සහ සමාජ මාධ්‍ය (social media) වැනි මාර්ගගත ක්‍රමවේදයන් යොදා ගනිමින් මෙම වේදිකාව හරහා නව නිපැයුම්කරුවන්ගේ නව නිර්මාණ මෙන්ම විවිධ ක්ෂේත්‍රයන් හි දැනුම බෙදා හදා ගැනීම සඳහා සම්පාදිත විඩියෝ ප්‍රචාරණය කිරීමට කටයුතු සලස්වා ඇත. ඒ අනුව යූ ටියුබ් නාලිකාවට වීඩියෝ 100 කට වඩා වැඩි ප්‍රමාණයක් සහ ග්‍රාහකයින් 1000 ක් දැනටමත් ඇතුලත්ව තිබීම සතුටුදායක ප්‍රගතියකි.

මෙමඟින් නවෝත්පාදන සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම, සම්පත් දායකයින්ගේ මහ පෙන්වීම ලබා දීම සහ නව නිපැයුම් පිළිබඳ දැනුවත් කිරීම, නව තාක්ෂණික දැනුම ලබාදීම සහ පාසල් සිසුන් අතර දැනුම පරතරය අවම කිරීම වැනි විශේෂ ප්‍රතිලාභ රැසක් ලබා ගත හැකිය.





2.8 දේශීය හා ජාත්‍යන්තර වශයෙන් බුද්ධිමය දේපළ අයිතීන් සුරැකීමට නව නිපැයුම්කරුවන්ට සහාය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ අයිතීන් සුරකිමින් දේශීය වශයෙන් ලබාදිය හැකි උසස් තත්ත්වයේ තාක්ෂණික දැනුම සහ අදාල සේවාවන් ලබාදීමත්, ඔවුන්ගේ නවෝත්පාදන හැකියාවන් අයුතු ලෙස ප්‍රයෝජනයට ගැනීම වළක්වාලමින් බුද්ධිමය දේපළ අයිතිය සුරක්ෂිතව කළමනාකරණය කිරීමත් වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හැකි උපරිම අයුරින් සහයෝගයන් ලබාදෙයි.

මේ සඳහා අවශ්‍ය දැනුම විධිමත්ව ලබාගැනීම වෙනුවෙන් ලෝක බුද්ධිමය දේපළ කාර්යාලයේ හා ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයේ සහයෝගය මත කොමිසමේ කාර්යමණ්ඩලය, තාක්ෂණ, නවෝත්පාදන සහයෝගිතා මධ්‍යස්ථාන (Technology and Innovation Support Center - TISC) වැඩසටහන යටතේ මනා පුහුණුවක් ද ලබා ඇත.

2021 වසර සඳහා පේටන්ට් අයදුම් කිරීමේ දී නව නිපැයුම්කරුවනට සහාය ලබාදීම පිළිබඳ සංඛ්‍යාත්මක තොරතුරු පහත දැක්වේ.

පේටන්ට් සංරචනය පිළිබඳ පවත්වන ලද මුළු වැඩසටහන් සංඛ්‍යාව	-	11
පේටන්ට් අයදුම් කිරීම සඳහා සහාය ලබා දුන් සංඛ්‍යාව	-	16
කොමිසමේ සහයෝගය ලබමින් පේටන්ට් අයදුම් කළ සංඛ්‍යාව	-	38

බුද්ධිමය දේපළ අයිතිය පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සහ එය ඉල්ලුම් කිරීමට අදාල මූල්‍යමය සහයෝගය ලබාදීම හරහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් වාර්ෂිකව අයදුම් කෙරෙන පේටන්ට් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා කොමිසම විසින් දැනටමත් විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරමින් සිටී.

ඒ අනුව, 2021 වසර තුලදී බස්නාහිර පළාත හැර අනෙක් පළාත් අටෙහි දැනුවත් කිරීමේ සැසි 08 ක් ද පේටන්ට් සඳහා අයදුම් කිරීම හා එහි වැදගත්කම පිළිබඳව මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ වැඩසටහන් 02 ක් හා පේටන්ට් සංරචනය පිළිබඳව කෘෂිකර්ම අමාත්‍යාංශය සමඟ සම්බන්ධ වෙමින් වැඩමුළුවක් සංවිධානය කෙරිණි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ සහයෝගයෙන් පවත්වන ලද පේටන්ට් බලපත්‍ර කෙටුම්පත් කිරීමේ වැඩමුළුව මඟින් නව නිපැයුම්කරුවන් 38 දෙනෙකුට ප්‍රතිලාභ අත් කර ගැනීමට හැකි විය.

ජාත්‍යන්තර පේටන්ට් අයදුම් කිරීම සඳහා සහාය ලබා ගැනීමේ ක්‍රමවේදය

දේශීය නව නිපැයුම්කරුවන් හට ජාත්‍යන්තර පේටන්ට් බලපත්‍ර සඳහා අයදුම් කිරීමේ ගාස්තු, පේටන්ට් සහයෝගිතා ගිවිසුම් (PCT) ගාස්තු මෙන්ම නෛතික කටයුතු සඳහා අදාල ගාස්තුව ප්‍රතිපූරණය වෙනුවෙන් ද කොමිසමේ සහයෝගය ලබාදීම සිදු කරයි. එම සේවාව ලබාගැනීම සඳහා නව නිපැයුම්කරු විසින් ගෙවීම් පිළිබඳ සාක්ෂි සහ රටට එමඟින් හිමි වන සමාජ, ආර්ථික, පාරිසරික හා වෙනත් ප්‍රතිලාභයන් පිළිබඳ පිළිගත හැකි ආයෝජන සැලැස්මක් සමඟ ලිඛිත ඉල්ලීමක් කොමිසම වෙත ඉදිරිපත් කළ යුතු ය.

2.9 කාලීන සමාජයීය ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම්

- **නවෝත්පාදන විසඳුම් තුළින් මිනිසුන් හා වන ජීවීන් අතර ඇති වන ගැටීම් අවම කිරීම සඳහා ව්‍යාපෘති**

වර්තමානයේ සුලභ ගැටළුවක් බවට පත්ව ඇති වන ජීවීන් හා මිනිසුන් අතර ගැටළු අවම කිරීම සඳහා ස්ථිරසාර විසඳුම් සම්පාදනය කිරීමේ අභිප්‍රාය ඇතිව කොමිසම විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මිනිසුන් හා වන ජීවීන් අතර ඇතිවන ගැටුම් හේතුවෙන් දේශීය ආර්ථිකයට සිදු වන හානිය අතිමහත් ය. මෙම ගැටුම් අවම කිරීම උදෙසා අවශ්‍ය තාක්ෂණික උපකරණ ආනයනය සඳහා විශාල මුදලක් වාර්ෂිකව වැය කළ යුතු ය. මෙම ගැටලු සඳහා නව නිපැයුම් තුළින් විසඳුම් ලබා දෙමින් දේශීය ආර්ථිකය නහා සිටුවන අතරතුර මිනිසුන් හා වන ජීවීන් අතර ඇතිවන ගැටුම් සඳහා දිගු කාලීන හා තිරසාර විසඳුම් ලබා දීම සඳහා කොමිසම විසින් මෙම ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී.

මෙම වැඩසටහන සඳහා ප්‍රධාන පාර්ශවකරුවන් ලෙස ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම, වන ජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය, නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශය සහ වන ජීවී රැකවරණය, අලිවැට හා අගල් ඉදිකිරීම ඇතුලු ආරක්ෂිත වැඩපිළිවෙලවල් හා කැලෑ නැවත වගා කිරීම හා වන සම්පත් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශය සහභාගී විය.

ප්‍රායෝගිකව ක්‍රියාවට නැංවිය හැකි නව නිපැයුම් සඳහා මූලාකෘති සකස් කිරීම සහ වැඩි දියුණු කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ සහයෝගය ලබා දී ඇත. සකස් කරන ලද මූලාකෘති ඉහතින් දක්වන ලද ආයතනයන්ගේ මැදිහත්වීම මත සහ මූල්‍යමය දායකත්වය ඇතිව ස්ථාපනය කර, ක්ෂේත්‍ර පරීක්ෂණයක් මඟින් ඒවායේ ප්‍රගතිය අධ්‍යයනය කරන ලද අතර, ඒ හරහා සාර්ථක නව නිපැයුම් කිහිපයක් හඳුනා ගැනීමට කොමිසමට හැකියාව ලැබී ඇත.

එම හඳුනා ගන්නා ලද නව නිපැයුම් භාවිතයෙන් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය හා එක්ව මහවැලි කලාපයන් තුළ පවතින විදුලි වැට දේශීය නව නිපැයුම් මඟින් බල ගන්වා, මහවැලි කලාපයන් තුළ මිනිසුන් හා වන ජීවීන් අතර ඇති වන ගැටුම් අවම කිරීම සඳහා ව්‍යාපෘති කිහිපයක්ම ක්‍රියාත්මක කරන ලදී. මෙමඟින් දේශීය නව නිපැයුම් වාණිජකරණය කිරීම ප්‍රධානතම අරමුණ වන අතර, තවත් අරමුණක් වන්නේ වන ජීවීන් මඟින් සිදු වන වගා හානි ඇතුලු දේපළ හානි හේතුවෙන් දේශීය ආර්ථිකයට සෘජු සහ වක්‍රාකාරයෙන් අහිමි වන සම්පත් ප්‍රමාණය අවම කිරීම යි.

මෙම අරමුණු මත පදනම්ව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක්ව පළමු අදියර ලෙස මහවැලි “බී” සහ “සී” කලාප තුළ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘතීන් දේශීය නව නිපැයුම් මඟින් බල ගන්වන ලද අතර, මේ වන විටත් සාර්ථක ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී.

මහවැලි කලාප සඳහා අවශ්‍ය වන බීජ වී සපයන ප්‍රමුඛතම ගොවිපල ද්විත්වය වන මහවැලි “බී” කලාපයට අයත් අරලගංවිල බීජ ගොවිපල වටා කිලෝ මීටර 7.5 ක දිගකින් යුතු විදුලි වැටක් සහ රත්කිඳ මහවැලි පුහුණු මධ්‍යස්ථාන ගොවිපල වටා කිලෝ මීටර 9.8 ක දිගකින් යුතු විදුලි වැටක් දේශීය නව නිපැයුම් මඟින් බලගන්වා අවසන් කිරීමට හැකි වීම දේශීය නව නිපැයුම්කරුවන් ලද සුවිශේෂී ජයග්‍රහණයකි.

මෙම ව්‍යාපෘතීන්ට අමතරව මහවැලි “එල්” කලාපය සහ මහවැලි “සී” කලාපය ආශ්‍රිතව තවත් ව්‍යාපෘතීන් කිහිපයක්ම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු මේ වන විට සම්පාදනය කරමින් පවතී. මෙම ව්‍යාපෘතීන් තුළින් ලද ජයග්‍රහණයන් සමස්ත දැයම ලද ජයග්‍රහණයන් ලෙස සඳහන් කිරීම වඩාත් උචිත ය.

- *අලි සඳහා රේඩියෝ කරපටි*

කොමිසම විසින් බැටරි සහ ද්විත්ව සංඛ්‍යාත ද්වි-මාර්ග සන්නිවේදනය සහිත නව්‍ය දුරස්ථ සංවේදක අලි කොලරය දේශීයව නිෂ්පාදනය කිරීම සඳහා ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ට මඟ පෙන්වන ලද අතර, අවශ්‍ය පහසුකම් ද සලසන ලදී. මෙය ජල ප්‍රතිරෝධක සහ කම්පන වරන කරපටියක් වන අතර මෙම කරපටිය භාවිතයෙන් වන සතුන්ගේ හදිසි අනතුරු සහ හදිසි ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කළ හැකි ය.





මෙම කරපටි දේශීයව නිෂ්පාදනය කිරීමට කටයුතු සැලසීම තුළින් මෙම වසර තුළ විදේශ රටවලට යා යුතුව තිබූ ඩොලර් 375,000.00 ක පමණ මුදලක් ඉතිරි කර ගත හැකි අතර වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම කරපටි 50 ක් මිලදී ගැනීමට එකඟත්වය ද පල කර ඇත.






- **"Zero to Hero" ව්‍යාපෘතිය**

දේශීය නව නිපැයුම්කරුවන් ව්‍යවසායකයින් බවට පත්කිරීම සඳහා කොමිසම විසින් මෙම වැඩසටහන ක්‍රියාත්මක කරනු ලබයි. දේශීය නව නිපැයුම්වලින් ආර්ථිකය සවිබල ගැන්වීම මෙම වැඩසටහන් මාලාවේ අරමුණ වේ.

නව නිපැයුම්කරුවන් හට වෙළෙඳපොළ සොයා ගැනීමත්, ආයෝජකයන් හට නව නිපැයුම් හඳුන්වා දීම හරහා වාණිජකරණය අවශ්‍යතා සපුරාලීමත්, මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය සහයෝගය තුලින් නව නිපැයුම් නිවැරදිව සමාජගත කිරීමත් මේ ඔස්සේ සිදු කරනු ලබයි.

මෙම වැඩසටහන යටතේ නවෝත්පාදන තුළින් රැකියා උත්පාදනය කරන අතරම දේශීය ආර්ථිකයට සාර්ථකව බද්ධ කළ හැකි ව්‍යාපාර ස්ථාන ආරම්භ කිරීමට ද කොමිසම සහයෝගය දෙනු ලබයි. මෙම ව්‍යාපෘතිය මඟින් ආරම්භක ව්‍යාපාර 03 ක් බිහිකිරීම සඳහා කොමිසමේ මඟපෙන්වීම හා සහයෝගය ලබා දී ඇත.





- **නවෝත්පාදන ඇසුරින් අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීමේ ව්‍යාපෘතිය - WMA සමඟ ව්‍යාපෘතිය**

වර්තමානයේ කෘෂිකර්මාන්තය බොහෝ දුරට රඳා පවතින්නේ රසායනික පොහොර, පළිබෝධනාශක සහ වල්නාශක වැනි බොහොමයක් කෘෂි රසායන භාවිතය මත ය. මෙම කෘෂි රසායන අධික ලෙස භාවිතය පාරිසරික වශයෙන් බලපෑමක් ඇති කරන අතරම, මූල්‍යමය වශයෙන් ද රජයට දැරිය නොහැකි පිරිවැයකි.

මෙම කරුණු සියල්ල සලකමින් පරිසරය තිරසාර ලෙස ආරක්ෂා කිරීම සහ කළමනාකරණය කිරීම සඳහා දේශීය නව නිපැයුම් ආශ්‍රයෙන් විසඳුම් ලබාදීම වෙනුවෙන් කොමිසම විසින් අපද්‍රව්‍ය කළමනාකරණ අධිකාරිය (WMA-WP) සමඟ සහයෝගීත්ව ව්‍යාපෘතියක් ආරම්භ කර තිබේ. මෙමගින් දේශීය නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය අත්හදා බැලීම් සහ කසළ කළමනාකරණයට අදාළ ඔවුන්ගේ නව නිපැයුම් තවදුරටත් ප්‍රවර්ධනය සඳහා වේදිකාවක් නිර්මාණය කිරීමට කටයුතු කරමින් පවතී.

ඒ අනුව, පෙතියාකන්ද "මිහිසරු" සම්පත් කළමනාකරණ මධ්‍යස්ථානය කේන්ද්‍ර කර ගෙනිමින් මෙම වැඩසටහන ක්‍රියාත්මක වන අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් රසායනික පොහොර වෙනුවට විකල්ප ලෙස භාවිතා කළ හැකි පරිසර හිතකාමී කාබනික පොහොර නිපදවීම හා ඒ ආශ්‍රිත පර්යේෂණ සඳහා ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන්ට අවශ්‍ය යටිතල පහසුකම් සැපයීම කොමිසම විසින් සිදු කරනු ලබයි.

- **"Tea Talk"– නව්‍ය විසඳුම් හරහා තේ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා වූ ව්‍යාපෘතිය**

ශ්‍රී ලංකාවේ කර්මාන්ත අංශය දේශීය ආර්ථිකයට සෘජු දායකත්වයක් ලබාදිය හැකි ඵලදායී සහ වැදගත් අංශයකි. ඒ අනුව කර්මාන්ත ක්ෂේත්‍රය ඉලක්ක කර ගනිමින් ඵලදායී නවෝත්පාදන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම කෙරෙහි ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ අවධානය යොමු වී තිබේ.

ඒ අනුව එහි පළමු අදියර වශයෙන් දේශීය ආර්ථිකයේ කැපී පෙනෙන ස්ථානයක් හිමි තේ කර්මාන්තයට බලපාන ගැටලු විසඳීම සඳහා 'Tea Talk' නමින් වැඩසටහනක් දියත් කිරීමට කොමිසම සැලසුම් කර ඇත.

තේ කර්මාන්තයේ ගැටලුවලට නව්‍ය විසඳුම් ලබාදෙන අතරම එම නව්‍ය විසඳුම් නිෂ්පාදන ලෙස වෙළෙඳපොළට හඳුන්වා දීම මෙහි අපේක්ෂාව යි. පළමු පියවර ලෙස, තේ කර්මාන්තයේ නියැලෙන්නන් සම්බන්ධ කර ගනිමින් කර්මාන්තයට

බලපාන තාක්ෂණික ගැටළු හඳුනාගෙන, පසුව නව නිපැයුම්කරුවන් වෙතින් මෙම ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් සෙවීමට උත්සාහ කරයි. එම නවෝත්පාදන විසඳුම් කොමිසමේ දායකත්වය මත ක්ෂේත්‍රයේ විශේෂඥයින්ගේ මැදිහත්වීමෙන් විනිශ්චය කරන අතර, කොමිසමේ දායකත්වය මත නිපැයුම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීමට ද කටයුතු කරනු ලබයි. ඉන්පසුව විධිමත්ව වැඩි දියුණු කරන ලද නව නිපැයුම් කොමිසමේ මහජෙන්වීම සහ ආයෝජකයින්ගේ මැදිහත්වීම මත වාණිජකරණ ක්‍රියාවලියට යොමු කෙරේ.

මෙම වැඩසටහන මහජනතාව අතරට ගෙන යෑම සඳහා රූපවාහිනී මාධ්‍ය වැඩසටහන් මාලාවක් ලෙස විකාශය කිරීමට සැලසුම් කර ඇති අතර, තේ ක්ෂේත්‍රයේ ප්‍රමුඛතම ආයතනයක් වන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ අනුග්‍රාහක දායකත්වය ද මෙම වැඩසටහන සඳහා හිමිව තිබේ.


- **"Fight Against COVID-19" කොරෝනා වසංගතයට එරෙහි නවෝත්පාදන වැඩි දියුණු කිරීම**

කොරෝනා ගෝලීය වසංගත තත්ත්වයෙන් වැළකී සිටීමින් ඊට සාර්ථකව මුහුණ දීම සඳහා නවෝත්පාදන තුලින් විසඳුම් සෙවීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම විසින් "Fight Against COVID 19" ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. වසංගතය හේතුවෙන් අකර්මණ්‍ය වන ව්‍යාපාර ක්ෂේත්‍රය බිඳවැටීමකින් තොරව පවත්වා ගැනීමට සහ ජාතික ආර්ථිකයට ඔවුන්ගේ දායකත්වය සැලකිය යුතු ලෙස ලබා දීම ට "Fight Against COVID 19" සාර්ථක පදනමක් බවට පත් විය. ඒ අනුව සාර්ථක නව නිපැයුම් හඳුනා ගනිමින් එම නිපැයුම් වාණිජකරණය සඳහා සහයෝගය ලබා දීමට කොමිසම කටයුතු කරන ලදී.

2021 වසරේදී 'කොවිඩ් -19 පිටු දකිමු' නව නිපැයුම් වාණිජ කරණය සඳහා යොමු කිරීම නමැති රාජ්‍ය තේමාව යටතේ COVID-19 වසංගත තත්ත්වයට එරෙහිව සටන් කිරීමට උපකාර වන නව නිපැයුම් හතරක් (04) සමාජගත කිරීමට කොමිසම විසින් කටයුතු කරන ලදී [Microorganism Diverting and Clearing Device, Video Laryngoscope, Microorganism Destroying & Air Filtering Unit, Smooth Lateral Patient Transfer Apparatus (Bed Trolly)]. මෙම අවස්ථාව සඳහා රේඛීය අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍ය ගරු (විශේෂඥ වෛද්‍ය) සීතා අරඹේපොළ මහත්මිය, ඖෂධ නිෂ්පාදනය, සැපයීම හා නියාමන රාජ්‍ය අමාත්‍ය ගරු (මහාචාර්ය) චන්න ජයසුමන මහතා, කොමිසමේ කොමසාරිස් මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු මහතා, කොමිසම අධ්‍යක්ෂ / ප්‍ර.වි.නි. එන්. එන්. ඩබ්. දොළවත්ත මහතා සහ අමාත්‍යාංශ නිලධාරීන්, නව නිපැයුම්කරුවන් සහ මාධ්‍ය නිලධාරීන් ඇතුළු පිරිසක් සහභාගී විය.







2.10 පර්යේෂණයන් එළිදැක්වීම සඳහා වූ ජාත්‍යන්තර සමුළුව - (“From Innovation to Impact –FITI” 2021)

නව නිපැයුම්කරුවන්ගේ නව අදහස්, නව පර්යේෂණ නව නිපැයුම්කරුවාට සීමා නොවී ජාත්‍යන්තරය දක්වා ව්‍යාප්ත විය යුතු අතර, එය නිර්මාණශීලීත්වය නිවැරදිව සමාජගතවීමට පිටුවහලක් වේ. ඒ අනුව, නවෝත්පාදකයන් හට සිය පර්යේෂණයන් එළිදැක්වීම, නව නිපැයුම් පිළිබඳව හැදෑරීම මෙන්ම තම පර්යේෂණ අවශ්‍යතා සඳහා මාර්ගෝපදේශකත්වය ලබාගැනීම වෙනුවෙන් “From Innovation to Impact (FITI)” නමින් සුවිශේෂී ජාත්‍යන්තර සමුළුවක් ලංකා ඉතිහාසයේ ප්‍රථම වරට 2019 වසරේ දී ආරම්භ කරන ලදී. මෙය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම හා ශ්‍රී ලංකා විද්‍යාභිවර්ධන සංගමය (Sri Lanka Association for the Advancement of Science-SLAAS) එක්ව සංවිධානය කරන්නකි. FITI සමුළුව 2021 වසරේ දෙසැම්බර් 08 වන දින බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලා පරිශ්‍රයේ දී සාර්ථකව පවත්වන ලදී.



මෙම වැඩසටහන හරහා ලොව පිළිගත් විශාලතම “IEEE” නම් “Scopus Indexed” ජර්නලයෙහි පර්යේෂණ ලිපි පළ කිරීමේ අවස්ථාව ද හිමි වන අතර, පර්යේෂකයන් සඳහා එය ඉතා වැදගත් අවස්ථාවකි. මෙහිදී පර්යේෂණ ලිපි 30 ට අසන්න ගණනක් එළි දක්වන ලද අතර, පර්යේෂණ හා සංවර්ධන නවෝත්පාදනවල සමාජීය බලපෑම සහ නවෝත්පාදනයේ සමාජීය බලපෑම යන ප්‍රධාන මාතෘකාවන් යටතේ සිය පර්යේෂණ ලිපි ඉදිරිපත් කිරීම සඳහා නව නිපයුම්කරුවන්ට අවස්ථාව සැලසුණි.





දේශීය සහ විදේශීය ප්‍රවීණ ඇගයීම් මඩුල්ලක් මගින් විනිශ්චය කටයුතු සිදු කරන ලදී. මෙහි ප්‍රධාන කථිකයන් ලෙසින් එක්සත් රාජධානියෙහි ක්වීන්ස් (Queen's) විශ්වවිද්‍යාලයේ භෞතික රසායනය පිළිබඳ මහාචාර්ය ස්ටීවන් බෙල් (Steven Bell) මහතා ද යාපනය විශ්වවිද්‍යාලයේ විදුලි හා ඉලෙක්ට්‍රොනික ඉංජිනේරු විදයාව පිළිබඳ මහාචාර අත්පුතරාජා අරුලම්පලම් මහතා ද සම්බන්ධවිය.

2.11 Idea Incubator (අදහස් උත්පාදක මැදිරිය)

Idea Incubator යනු නව නිපැයුම්කරුවන්ගේ වටිනා අදහස් වාණිජමය වශයෙන් වැඩිදියුණු කළ හැකි නිර්මාණ බවට පත් කිරීමේ අරමුණින් කොමිසම පරිශ්‍රයේ ස්ථාපිත කරන ලද මැදිරියකි. දැනුම බෙදාගැනීමේ වේදිකාව, අංග සම්පූර්ණ චිත්‍රාගාර / රූපගත කිරීමේ පහසුකම්, නව නිපැයුම් සැලසුම් කිරීමේ දී අවශ්‍ය පරිගණක තාක්ෂණය හා නිෂ්පාදන පහසුකම් සහ ප්‍රේක්ෂක ධාරිතාව 80 කට වැඩි වූ ශ්‍රවණාගාර පහසුකම යනාදියෙන් මෙය සමන්විත වේ.

2.12 නව නිපැයුම්කරුවන්ට විශේෂිත සේවාවන් ලබාදීම

- නව නිපැයුම් 02 කට අදාළ පරීක්ෂණ සිදු කිරීම සඳහා කාර්මික තාක්ෂණ ආයතනය (ITI) වෙත යොමු කරන ලදී.
- මූලාකෘති සංවර්ධනය කිරීම සඳහා නව නිපැයුම් 02ක් NERD ආයතනය වෙත යොමු කරන ලදී.
- නව නිපැයුමකට අදාළ පරීක්ෂණ කටයුතු සඳහා NIFS වෙත යොමු කරන ලදී.
- නව නිපැයුම් 02 ක් මූලාකෘතිකරණය සහ වැඩිදියුණු කිරීම වෙනුවෙන් ශක්‍යතා පරීක්ෂාවක් සිදු කිරීම වෙනුවෙන් සුනිත්‍ය බලශක්ති අධිකාරිය වෙත යොමු කරන ලදී.
- එක් නව නිපැයුමක් ජාත්‍යන්තරයට හඳුන්වා දීම වෙනුවෙන් බදු සහන සේවා ලබා ගැනීමට කොමිසම සහාය විය.
- නව නිපැයුම්කරුවෙකුට අවශ්‍ය උපාංග රේගුවෙන් මුදා ගැනීම සඳහා කොමිසම සහාය විය.
- නව නිපැයුම් 22 ක මූලාකෘති සංවර්ධනය කිරීම වෙනුවෙන් සහාය ලබාදුනි.

2.13 නව නිපැයුම්කරුවන්ගේ හමුව

නව නිපැයුම්කරුවන් හට තමන් මුහුණ පා සිටින ගැටළු සෘජුව ඉදිරිපත් කිරීමත්, ඒ පිළිබඳව සාකච්ඡා කිරීමත්, විසඳුම් කරා යොමු වීමත් වෙනුවෙන් මෙම හමුව සංවිධානය කරනු ලබයි. 2021 වසරේ පැවැති නව නිපැයුම්කරුවන්ගේ හමුව දෙසැම්බර් මස 28 වන දින නව නිපැයුම්කරුවන් 65 දෙනෙකු ගේ සහභාගීත්වයෙන් හෙක්ටර් කොඩ්බෑකඩුව ගොවි පර්යේෂණ හා පුහුණු ආයතනයේ දී (HARTI) පවත්වන ලදී.

2.14 අන්තර්ජාතික පිළිගැනීම

ගෝලීය වශයෙන් නව නිපැයුම් සහ නවෝත්පාදන දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සම්බන්ධව ලොව පිළිගත් **අන්තර්ජාතික නව නිපැයුම්කරුවන්ගේ සංවිධානය (IFIA)** හා **ලෝක නව නිපැයුම් සහ බුද්ධිමය දේපල සංවිධානය (WIIPA)** යන ජාත්‍යන්තර සංගම් දෙකෙහි සාමාජිකත්වය ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම වෙත හිමි වී ඇත. ඒ හරහා කොමිසමේ ජාත්‍යන්තර සබඳතා තවදුරටත් වර්ධනය වී ඇත.

මෙම සාමාජිකත්වයන් ලබාගැනීම තුලින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට යොවුන්, විවෘත, කාන්තා යනාදී වූ විවිධ කාණ්ඩයන් නියෝජනය කරන ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ රැසකට සහභාගී වීමේ දුර්ලභ අවස්ථාව හිමි වී ඇත. මෙම සංවිධාන මඟින් සිදු කරන සේවාවන් ලෙස පුහුණු වැඩසටහන් පැවැත්වීම, නව නිපැයුම් වාණිජකරණය, බුද්ධිමය දේපළ අයිතිය සුරැකීම, පරිසර හිතකාමී නව නිපැයුම් ප්‍රවර්ධනය සහ නව නිපැයුම් මෙන්ම නව නිපැයුම්කරුවන්ගේ ව්‍යාපෘති සඳහා ප්‍රචාරණය ලබාදීම සිදු කරන අතර, ඔවුන් ගේ වෙබ් අඩවි හා සඟරා වැනි





මුද්‍රිත මාධ්‍ය හරහා ද නව නිපැයුම් පිළිබඳ නවතම තොරතුරු ප්‍රචාරණය සිදු කරනු ලබයි. එමෙන්ම ජයග්‍රාහී නව නිපැයුම් සඳහා පදක්කම් හා ත්‍යාග මුදල් ද ප්‍රදානය කිරීම ද විශේෂත්වයකි.

ඒ හැරුණු විට තරඟ සඳහා ගුවන් ටිකට්පත්, නවාතැන් පහසුකම් වෙනුවෙන් අනුග්‍රහ දැක්වීම මෙන්ම නව නිපැයුම් ප්‍රදර්ශන සඳහා ලියාපදිංචිය, ප්‍රදර්ශන කුටි සැපයීම හා ප්‍රවාහන පහසුකම් සම්පාදනය යනාදී කටයුතු වල දී සහනශීලීව කටයුතු කිරීම මගින් ද සහයෝගය ලබාදෙයි. මෙම දිරිගැන්වීම් සහ පිළිගැනීම් ශ්‍රී ලාංකීය නව නිපැයුම්කරුවන්ට ඔවුන් ගේ නව නිපැයුම් දේශීය හා විදේශීය වෙළෙඳපළ තුල වාණිජකරණය කිරීම වැනි කටයුතු සඳහා මහඟු පිටුවහලකි.

සහසක් නිමැවුම් තරඟයේ ජයග්‍රාහකයින් මෙම ජාත්‍යන්තර සංගම්වල අනුග්‍රහයෙන් ලොව පුරා පැවැත්වෙන ජාත්‍යන්තර නව නිපැයුම් තරඟ සඳහා සහභාගී වීමට සුදුසුකම් ලබයි.

2.15 ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය

ශ්‍රී ලාංකේය නව නිපැයුම්කරුවන් විසින් ඉටු කරන්නා වූ මෙහෙවර හා දේශීය ආර්ථිකය වෙනුවෙන් ලබාදෙන්නා වූ දායකත්වය ඇගයීම සඳහා සෑම වසරකම ඔක්තෝබර් මස 26 වන දින ජාතික නව නිපැයුම්කරුවන්ගේ දිනය ලෙස අමාත්‍යමණ්ඩල අනුමැතියෙන් සම්මත වී ඇත. ශ්‍රේෂ්ඨ ඉංජිනේරුවරයෙකු මෙන්ම ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ ප්‍රථම කොමසාරිස් ධුරය හෙබ වූ දේශබන්දු ආචාර්ය ඒ. එන්. එස්. කුලසිංහ මැතිතුමන් විසින් ඉටු කළ අපරිමිත සේවාව ඇගයීම උදෙසා එතුමන් ගේ ජන්ම දිනය පාදක කර ගනිමින් මෙම දිනය ප්‍රකාශයට පත් කර තිබේ.

ජාතික නව නිපැයුම්කරුවන් ගේ දිනය ස්ථාපිත කිරීමේ අරමුණු

- නව නිපැයුම්කරුවන් ඇගයීම සඳහා නව වැඩපිළිවෙලක් සකස් කිරීම හා නව නිපැයුම්කරණය කෙරෙහි ඔවුන් දිරි ගන්වමින් නවෝත්පාදන ආර්ථිකයක් කරා රට මෙහෙයවීම.

- නව නිපැයුම්කරුවන්ගේ දිනය ප්‍රකාශයට පත්කිරීම මඟින් නව ආයෝජන අවස්ථා ලබාදීම කෙරෙහි නව නිපැයුම්කරුවන් ගේ අවධානය ලබාගැනීම.

- නව සොයාගැනීම් තුළින් සංවර්ධිත ආර්ථිකයක් සාක්ෂාත් කරගැනීම සඳහා ශ්‍රී ලාංකීය නිපැයුම්කරුවන්ට ප්‍රමුඛත්වය ලබා දීම.

- නව නිපැයුම්කරුවන් හා සමීපව කටයුතු කිරීම සඳහා කොමිසමට අවස්ථාවක් හිමි වීම.

- සම්මානනීය නව නිපැයුම්කරුවන් හඳුනාගැනීම.

2.16 නව නිපැයුම් ප්‍රචලිත කිරීම

- **“Sri Lanka Inventors” - YouTube ප්‍රවේශය**

වාණිජකරණය සඳහා යෝග්‍ය දේශීය නව නිපැයුම් විධිමත්ව ලෝකයට විවෘත කිරීම හරහා නව නිපැයුම්කරුවන්ට අභිමානය ලභා කර දීමත්, දෙස් - විදෙස් ආයෝජකයන් වෙතින් එම නිපැයුම් වාණිජකරණයට සහාය ලබාගැනීමත් අරමුණු කරගනිමින් නවීන තාක්ෂණය ආශ්‍රයෙන් ලෝකය සමඟ ඉදිරියට ගමන් කිරීමට අවශ්‍ය පසුබිම සකස් කර දීම වෙනුවෙන් ක්‍රියාත්මක කළ නව වැඩසටහනකි. එමෙන්ම නවක නිපැයුම්කරුවන්ට නවෝත්පාදනය පිළිබඳව දැනුවත්භාවයක් ලබාගැනීමටත්, පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කිරීමේ ක්‍රියාවලිය ඇතුළු බොහොමයක් තොරතුරු පිළිබඳව නිසි අවබෝධයක් කඩිනමින් සහ ඕනෑම අවස්ථාවක ලබාගැනීමටත් මෙම චැනලය හරහා අවකාශ සලසා දී තිබේ.

- **නිල වෙබ් අඩවිය**

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ නිල වෙබ් අඩවිය ඵලදායී ලෙස නව මුහුණුවරකින් යුතුව සංස්කරණය කර ඇත. මෙහිදී නව නිපැයුම්කරුවන්, ආයෝජකයන් මෙන්ම නවෝත්පාදනයට හිතැති ශ්‍රී ලාංකික ප්‍රජාව ගේ වැඩිමනත් ප්‍රයෝජනය උදෙසා පුළුල් සේවාවක් සැපයීම වෙනුවෙන් එය නිර්මාණය කර ඇත.

කර්මාන්ත ක්ෂේත්‍රය පසුබිම් වූ ගැටළු සඳහා නවෝත්පාදන විසඳුම් සොයන්නන් වෙනුවෙන් කොමිසමේ සම්බන්ධීකරණය යටතේ නව නිපැයුම්කරුවන් සමඟ සම්බන්ධ වීමේ අවස්ථාව ද මෙම වෙබ් අඩවිය සතු වීම සුවිශේෂී වේ.

2.17 මාධ්‍ය මෙහෙවර

ශ්‍රී ලංකාව තුල නවෝත්පාදන සංස්කෘතියක් බිහි කිරීම උදෙසා දේශීය නව නිපැයුම් ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාවය සපුරාලීම වෙනුවෙන් මාධ්‍ය ප්‍රචාරණයට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයකි. එබැවින් ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සෑමවිටම මාධ්‍ය (විද්‍යුත්, මුද්‍රිත හා සමාජ මාධ්‍ය) සමඟ සහයෝගයෙන් කටයුතු කරන අතර, නවෝත්පාදන ප්‍රචලිත කිරීම සඳහා ස්වේච්ඡා සහයෝගය මාධ්‍ය වෙතින් ලබාගැනීමට ක්‍රියා කරයි.

නව නිපැයුම් හා නවෝත්පාදනයන් පිළිබඳ සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා කොමිසම විසින් ප්‍රචාරණ වියදම් වලින් තොරව වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට සෑම විටම උත්සාහ දරන අතර, පහත වැඩසටහන ඊට උදාහරණයකි.

- **දෙරණ "STARTUP 2021"**

රාජ්‍ය-පෞද්ගලික හවුල්කාරිත්ව පදනම මත නවෝත්පාදන තුළින් නව ව්‍යවසායකයින් බිහිකිරීමේ උත්සාහයක් ලෙස දෙරණ නාලිකාව විසින් ආරම්භ කරන ලද "STARTUP 2021" වැඩසටහනෙහි උපායමාර්ගික හවුල්කරුවෙකු ලෙස අවබෝධතා ගිවිසුමක් (MoU) තුළින් කොමිසම මේ සම්බන්ධයෙන් ක්‍රියා කරනු ලබයි





එහි දැනට ඇගයීම් ක්‍රියාවලිය අවසන් කර ඇති අතර තෝරාගත් නව නිපැයුම්කරුවන් / ව්‍යවසායකයින් සඳහා දැනුවත් කිරීමේ වැඩමුළු පවත්වනු ලැබේ. "STARTUP 2021" යනු ශ්‍රී ලංකාවේ තරුණ ව්‍යවසායකයින් උපදේශනය සහ සංවර්ධනය කිරීම ඉලක්ක කරගත් රියැලිටි රූපවාහිනී වැඩසටහනකි. තම නව නිපැයුම් වාණිජකරණය කිරීම සඳහා විශේෂිත ව්‍යාපාරික උපදේශකයින්ගේ සහය ලබා ගැනීමටත්, ව්‍යාපාරික බුද්ධිය, දැනුම, පළපුරුද්ද සහ කුසලතා සංවර්ධනයටත් මෙමගින් අවස්ථාව සැලසෙන අතර ජයග්‍රාහකයින්ට තමන්ගේම ව්‍යාපාර ආරම්භ කිරීම සඳහා ප්‍රදානයන් ද හිමි වේ. එවැනි හවුල්කාරිත්වයන් තුළින් රට තුළ නවෝත්පාදන බිහි කිරීමට පහසුකම් සැලසීම හරහා නව ව්‍යවසායකයින් ගොඩනැගීමට කොමිසම අඛණ්ඩව කටයුතු කරනු ලබයි.

2.18 මානව සම්පත් සංවර්ධනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම දේශීය නව නිපැයුම්කරුවන් වෙනුවෙන් උපරිම සේවාවක් සැලසීම උදෙසා සුවිසල් මෙහෙවරක නිරත වන ආයතනයකි. නව නිපැයුම්කරුවන් වෙනුවෙන් ලබාදෙන එම සේවාව ගුණාත්මක හා කාර්යක්ෂමතාවයෙන් ඉහළ සේවාවක් බවට පත් කිරීම සඳහා කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය ඉහළ නැංවීම ද අත්‍යාවශ්‍ය වේ. ඒ අනුව, ඔවුන් විෂයානුබද්ධව විවිධ පුහුණු වැඩසටහන් සඳහා යොමු කිරීමට කටයුතු කර ඇත.

පහත දැක්වෙන්නේ 2021 වසර තුළ කාර්ය මණ්ඩල නිපුණතා සංවර්ධනය වෙනුවෙන් සහභාගීත්වය ලබා දුන් වැඩසටහන් පිළිබඳ තොරතුරු ය.

- සම්පත් දායකයින් ලෙස කොමිසමේ කාර්ය මණ්ඩලයේ නිලධාරීන් කිහිපදෙනෙකුගේ සේවය ලබා ගනිමින් කොමිසමේ අනෙකුත් කාර්ය මණ්ඩලය සහ ආයතනික පුහුණුවේ යෙදෙන ආධුනික පරිගණක පුහුණු ශිල්පීන් හට Microsoft Illustrator/ Photoshop මෘදුකාංගය පිළිබඳ එක් දිනක පරිගණක පුහුණු වැඩමුළුවක් පවත්වන ලදී.

- නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලැබූ "රාජ්‍ය හා පළාත් සභා මූල්‍ය කළමනාකරණ ව්‍යුහය හා මූල්‍ය කළමනාකරණය පිළිබඳ රාජ්‍ය නිලධාරීන්ගේ කාර්යභාරය හා වගකීම පිළිබඳ මූලික අවබෝධය" සම්බන්ධ දෙදින පුහුණු වැඩමුළුව සඳහා කොමිසමේ එක් නිලධාරිනියක් සම්බන්ධ විය.

- නිපුණතා සංවර්ධන අරමුදල මඟින් පවත්වනු ලැබූ Advanced Microsoft Excel Training for Data Analysis සම්බන්ධ තෙදින වැඩමුළුව සඳහා කොමිසමේ එක් නිලධාරිනියක් සම්බන්ධ විය.

- මාර්ගගත (Online) තාක්ෂණය උපයෝගී කර ගනිමින් මෙට්‍රොපොලිටන් කැම්පස් මඟින් පවත්වනු ලැබූ General Office Administration and E–Code සම්බන්ධ තෙදින වැඩමුළුව සඳහා කොමිසමේ නිලධාරීන් සිව් දෙනෙකු සහභාගි වී ඇත.

- මාර්ගගත (Online) තාක්ෂණය ඔස්සේ මෙට්‍රොපොලිටන් කැම්පස් මඟින් පවත්වනු ලැබූ Essentials in Project Management වැඩමුළුව සඳහා කොමිසමේ නිලධාරීන් දෙදෙනෙකු සහභාගී වී ඇත.

- මෙට්‍රොපොලිටන් කැම්පස් ආයතනය මෙහෙයවන ලද, මාර්ගගත (Online) තාක්ෂණය උපයෝගී කර ගනිමින් පවත්වනු ලැබූ Awareness Programme on E-procurement එක් දින සම්මන්ත්‍රණය සඳහා කොමිසමේ එක් නිලධාරිනියක් සහභාගි විය.

- ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය මඟින් පවත්වනු ලබන Higher National Diploma in Public Procurement and Contract Administration – 2021/2022 (අවුරුදු 01) පාඨමාලාව සඳහා කොමිසමේ නිලධාරීන් 04 දෙනෙකු යොමු කර ඇත.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
මූල්‍ය තත්ත්ව විස්තරය

දෙසැම්බර් **31** න් අවසන් දිනට	සටහන්	**2021**	**2020**
		රු.	රු.
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	**62,331,856**	66,587,892
උත්සව අත්තිකාරම්		**1,250**	-
ණයගැතියෝ	2	**11,396,880**	10,491,776
වෙනත් ලැබීම්		**-**	10,000
නැවත ලැබිය යුතු තැන්පතුව	3	**2,407,000**	2,407,000
අපදා ණය		**917,399**	756,212
COVID 19 වැඩසටහන යටතේ ලබාදුන් ණය		**722,718**	994,714
ජාතික ආධුනිකත්ව සහ පුහුණු අධිකාරිය වෙතින් ලැබීම්		**7,560**	7,560
වෙනත් අත්තිකාරම්		**136,633**	136,633
ඉදිරියට කල ගෙවීම්	4	**1,468,653**	592,860
නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල		**707,548**	1,050,885
(අඩු කළා) අඩමාන ණයකරුවන් සඳහා වෙන්කිරීම් (100%)	5	**(9,602,964)**	(9,802,964)
IAFM-SL ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය		**4,500,000**	-
ඉන්ධන තැන්පතු		**100,000**	100,000
ටී ෂර්ට් තොග	6	**414,480**	414,480
ලිපි දුව්‍ය තොග	6	**386,860**	445,954
		75,895,873	**74,193,002**
ජංගම නොවන වත්කම්			
නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල		**1,737,658**	2,198,830
COVID 19 වැඩසටහන යටතේ ලබාදුන් ණය		**237,729**	994,376
IAFM-SL ව්‍යාපෘතිය යටතේ ලබාදුන් ණය		**1,500,000**	-
ආපදා ණය		**2,953,058**	2,672,247
දේපළ, පිරියත හා උපකරණ	7	**47,349,863**	35,478,691
		53,778,308	**41,344,145**
මුළු වත්කම්		**129,674,181**	**115,537,147**
අරමුදල් සහ බැරකම්			
ජංගම බැරකම්			
ණයහිමි	8	**1,316,664**	167,330
උපචිත වියදම්	9	**2,201,973**	2,365,509
		3,518,637	2,532,839
ජංගම නොවන බැරකම්			
මහාවැලි ව්‍යාපෘතිය සඳහා වෙන්කිරීම්	10	**6,534,026**	-
පාරිතෝෂික වෙන්කිරීම්	11	**4,268,344**	3,682,614
IAFM-SL ව්‍යාපෘතිය	12	**36,472,155**	36,472,155
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	13	**37,921,883**	45,417,472
ප්‍රාග්ධන දායක අරමුදල	14	**9,905,989**	14,334,314
නව නිපැයුම්කරුවන්ගේ අරමුදල	15	**12,837,184**	13,240,886
මුළු බැරකම්		**111,458,217**	**115,680,281**
ශුද්ධ වත්කම්		**18,215,964**	**(143,134)**
ශුද්ධ වත්කම්/ හිමිකම්			
සම්මුචිචිත අරමුදල		**(3,284,036)**	(143,134)
ප්‍රත්‍යාගණන සංචිත		**21,500,000**	-
මුළු ශුද්ධ වත්කම්/ හිමිකම්		**18,215,964**	**(143,134)**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක **32** සිට **41** දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ඩී. ඒ. සරත්චන්ද්‍ර
සහකාර අධ්‍යක්ෂ (මුදල්)

එන්. එන්. ඩබ්. දොලවත්ත
අධ්‍යක්ෂ/ප්‍ර.වි.නි.

මෙම මූල්‍ය ප්‍රකාශය සැකසීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය සතුවේ.
මෙම මූල්‍ය ප්‍රකාශය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලද අතර අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන් පහත පරිදි අත්සන් තැබේ.

මහාචාර්ය එන්. එම්. එස්. සිරිමුතු
කොමසාරිස්

මහාචාර්ය. නීලිකා මලවිගේ
සහකාර කොමසාරිස්

2022 පෙබරවාරි 18
කොළඹ

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේකොමිසම

මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශය

දෙසැම්බර් **31** න් අවසන් වර්ෂය සඳහා	සටහන්	**2021**	**2020**
		රු.	රු.
ආදායම්			
රජයේ දායකත්වය			
රජයේ දායකත්වය - පුනරාවර්තන	16	40,370,000	40,600,000
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ව්‍යාපෘති වියදම්	20	10,107,926	4,355,907
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		533,750	270,000
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂය වීම් / ජංගම නොවන වත්කම්	7	1,686,650	1,735,688
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම ක්‍රමක්ෂය -යන්ත්‍ර හා උපකරණ		7,495,590	5,784,976
වෙනත් ආදායම්	17	1,243,843	1,559,070
මුළු ආදායම		**61,437,759**	**54,305,639**
වියදම්			
පුද්ගලික වේතන	18	19,424,172	17,430,480
පරිපාලන සහ ආයතනික වියදම්	19	25,010,573	25,154,266
ක්ෂය - ස්ථාවර වත්කම්	7	9,182,240	7,520,664
පාරිතෝෂික	11	585,730	862,357
නව නිපැයුම්කරුවන්ගේ දිරි දීමනා වියදම්	20	10,107,926	4,355,907
වෙනත් වියදම්	21	560,943	7,863
මුළු වියදම්		**64,871,583**	**55,331,537**
වසර සඳහා අතිරික්තය / (හිඟය)		**(3,433,824)**	**(1,025,898)**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක **32** සිට **41** දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

	සටහන්	ප්‍රත්‍යාගණන සංචිත	සම්මුවිචිත අරමුදල	මුළු ස්කන්ධය
		රු.	රු.	රු.
2020 ජනවාරි 01 දිනට ශේෂය		-	(238,936)	(238,936)
2020 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		-	(1,025,898)	(1,025,898)
2018 වර්ෂයේ දී W.M ජයවර්ධන මහතා විසින් ලබා ගත් අරමුදල පියවීම		-	603,810	603,810
පෙර වර්ෂය සඳහා අවලංගු කරන ලද ඉදිරියට කරන ලද වියදම්		-	6,000	6,000
වැඩිපුර ගෙවන ලද විනිශ්චය ගාස්තු		-	1,260	1,260
NERD ආයතනයේන් ආපසු ගෙවන ලද වියදම්		-	521,531	521,531
නිවැරදි කරන ලද ආපදා ණය ලේඛණයේ ඉතිරිය		-	(10,902)	(10,902)
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය		-	(143,134)	(143,134)
2020 වර්ෂය සඳහා වන ගැලපීම්				
පෙර වර්ෂය සඳහා අවලංගු කරන ලද මුද්දර බදු සඳහා කල වියදම්			25	25
අවලංගු කරන ලද චෙක් පත් ITI			292,896	292,896
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය (නැවත සකස් කරන ලද)		**-**	**149,787**	**149,788**
2021 ජනවාරි 01 දිනට ශේෂය		-	149,787	149,787
2021 වර්ෂය සඳහා අතිරික්තය / (හිඟය)		-	(3,433,824)	(3,433,824)
වාහන නැවත තක්සේරු කිරීම		21,500,000	-	21,500,000
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය		**21,500,000**	**(3,284,036)**	**18,215,964**

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක **32** සිට **41** දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම
මුදල් ප්‍රවාහ ප්‍රකාශය
දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා

	සටහන්	2021 රු.	2020 රු.
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහයන්			
අතිරික්තය/හිඟය		(3,433,824)	(1,025,898)
මුදල් නොවන සංචලන			
ක්ෂයවීම්	7	9,182,240	7,520,664
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ව්‍යාපෘති වියදම්	20	(10,107,926)	(4,355,907)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය- සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		(533,750)	(270,000)
ප්‍රාග්ධන ප්‍රදාන ක්‍රමක්ෂය - ක්ෂය වීම් / ස්ථාවර වත්කම්		(9,182,240)	(7,520,664)
NIPO ආයතනයෙන් ආධාර වශයෙන් ලද පරිසණකය		-	(70,000)
පාරිතෝෂිකය සඳහා වෙන් කිරීම්	11	585,730	862,357
නිවැරදි කරන ලද ආපදා ණය		-	(10,902)
අපහරණයෙන් ලද ලාභය		560,943	2,732
ගැලපීම් :			
ණයගැතියන්වෙනස්වීම - නොගෙවන ලද ණය		(905,105)	1,010
ලිපි ද්‍රව්‍ය තොග වෙනස්වීම්		59,095	39,292
ටී ෂර්ට් තොග වෙනස්වීම්		-	785
ඉදිරියට කල වියදම් හි වෙනස්වීම	3	(875,793)	1,677,698
උත්සව අත්තිකාරම් හිවෙනස්වීම		(1,250)	3,300
ගෙවිය යුතු වියදම් හි වෙනස්වීම		(163,536)	(9,819,960)
ලැබිය යුතු දැ හි වෙනස්වීම්		10,000	46,401
නැවත ගෙවිය යුතු තැන්පතුහි වෙනස්වීම්		-	(2,000)
ණයහිමියන්ගේ වෙනස්වීම		1,149,334	(3,694,809)
පෙර වර්ෂය සඳහා මුදල්මය ලැබීම්		-	1,132,601
		(13,656,080)	(15,483,301)
පරිතෝෂික ගෙවීම්		-	-
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(13,656,080)**	(15,483,301)
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලත් මුදල් ප්‍රවාහ			
දේපළ, පිරියත සහ උපකරණ මිලදී ගැනීම	7	(114,355)	(32,978,461)
මහවැලි ව්‍යාපෘතිය යටතේ සිදු කරන ලද වියදම්		(14,159,766)	-
ණය-නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් නැවත ගෙවීම්		616,024	469,552
ණය-නව නිපැයුම්කරුවන්ගේ අරමුදල් සඳහා වියදම්		(98,582)	(935,566)
ආපදා ණය ප්‍රදාන		(1,215,300)	(981,649)
ආපදා ණය නැවත ගෙවීම		773,303	709,169
"COVID 19වැඩසටහන" යටතේ ලබා දුන් ප්‍රධාන		(160,120)	(4,808,043)
"COVID 19 වැඩසටහන" යටතේ ලබා දුන් ණය		-	(2,350,000)
ණය ලබාදීම් අවලංගු කිරීම		805,000	-
"නව නිපැයුම් දිරිය වැඩසටහන" යටතේ ලබා දුන් ණය		(1,025,750)	(3,324,250)
IAFM-SL වැඩසටහන යටතේ ලබා දුන් ණය		(6,000,000)	-
ආයෝජන ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**(20,579,548)**	(44,199,248)
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලද මුදල් ප්‍රවාහ			
ප්‍රාග්ධන ප්‍රවාහ		7,900,000	24,538,000
මහවැලි ව්‍යාපෘතිය		22,079,592	-
මූල්‍යමය ක්‍රියාකාරකම් වලින් ලත් ශුද්ධ මුදල් ප්‍රවාහය		**29,979,592**	24,538,000
වසර තුළදී ශුද්ධ මුදල් හා මුදල් සමාන දේ (වැඩි වීම/ අඩු වීම)		(4,256,036)	(35,144,550)
වසර ආරම්භයේදී මුදල් හා මුදල් සමාන දේ		66,587,892	101,732,442
වසර අවසානයේදී මුදල් හා මුදල් සමාන දේ		**62,331,856**	**66,587,892**
මුදල් හා මුදල් සමාන දේ විශ්ලේෂණය			
A/C No.033-1-001-0-1791066		11,925,890	10,965,343
A/C No.033-1-001-2-1791065		48,954,908	54,567,720
A/C No.204402131791066		1,451,059	1,054,829
		62,331,856	66,587,892

අවසාන ගිණුම් ප්‍රකාශයේ සඳහන් කර ඇති ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පිටු අංක **32 සිට 41** දක්වා ඇති සටහන් සඳහා මෙම මූල්‍ය ප්‍රකාශයෙහි අත්‍යවශ්‍ය කොටස වේ.

ශ්‍රී ලංකා නවනිපැයුම්කරුවන්ගේ කොමිසම

අයවැය හා සංචිතයන් සංසන්දනය කිරීම

රු.

	අනුමත අයවැය		මහා භාණ්ඩාගාරයෙන් නිදහස් කරන ලද සංචිත	
	2021	**2020**	**2021**	**2020**
පුනරාවර්ථනය	**46,000,000.00**	40,600,000.00	**40,370,000.00**	40,600,000.00
ප්‍රාග්ධනය	**17,500,000.00**	43,300,000.00	**7,900,000.00**	24,538,000.00
එකතුව	**63,500,000.00**	**83,900,000.00**	**48,270,000.00**	**65,138,000.00**

වර්ෂය	රජයේ දායකත්වය ප්‍රාග්ධන (ශ්‍රී. ලං. රු)
1991	163,050.00
1992	1,700,000.00
1993	-
1994	250,000.00
1995	196,000.00
1996	113,500.00
1997	757,000.00
1998	1,700,000.00
1999	290,000.00
2000	4,500,000.00
2001	2,870,000.00
2002	700,000.00
2003	2,500,000.00
2004	621,000.00
2005	5,997,000.00
2006	33,991,000.00
2007	37,100,000.00
2008	24,106,000.00
2009	15,765,000.00
2010	4,500,000.00
2011	6,151,010.00
2012	21,562,000.00
2013	17,061,000.00
2014	40,000,000.00
2015	30,269,992.00
2016	57,248,655.00
2017	73,133,822.00
2018	85,750,000.00
2019	58,000,000.00
2020	24,538,000.00
2021	7,900,000.00

ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සහ පරිපාටීන්

01. කොමිසමේ තොරතුරු

ආයතනය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම් දිරි ගැන්වීමේ පනත යටතේ නව නිපැයුම් දිරිගැන්වීම , ප්‍රවර්ධනය හා නිෂ්පාදන සහ ඒ සම්බන්ධ ක්‍රියාකාරකම් සඳහා පිහිටුවා ඇති ව්‍යවස්ථාපිත ආයතනයකි.කොමිසම ක්‍රියාත්මක වන්නේ නිපුණතා සංවර්ධන, වෘත්තීය අධ්‍යාපන, පර්යේෂණ හා නව නිපැයුම් රාජ්‍ය අමාත්‍යාංශයේ විෂය පථය යටතේය.

2021 වර්ෂයේ කොමිසමේ කාර්යාලය, අංක 46 සහ 48, කොටා පාර, කොළඹ 08 හි පිහිටා ඇත.

02. සකස් කිරීමේ පදනම

මූල්‍ය ප්‍රකාශන සැකසීමේ පදනම වන්නේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතින්ට අදාලව ව්‍යවස්ථාපිත අවශ්‍යතා සඳහා වේ.

2.1 අනුකූලතා ප්‍රකාශනය

විගණකාධිපති සහ මූල්‍ය හා සැලසුම් අමාත්‍යාංශයේ සහභාගිත්වයෙන් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ රාජ්‍ය අංශ ගිණුම්කරණ කමිටුව විසින් නියම කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කරන ලදි.

මෙම මූල්‍ය ප්‍රකාශන වල පහත සඳහන් අංශ ඇතුලත් වේ.

- මූල්‍ය ත්ත්ත්ව ප්‍රකාශනය
- මූල්‍යමය කාර්ය සාධන ප්‍රකාශනය
- ස්කන්ධ වෙනස්වීමේ ප්‍රකාශනය
- මුදල් ප්‍රවාහ ප්‍රකාශනය
- මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

2.2 මූල්‍ය ප්‍රකාශන සඳහා වගකීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතින්ට අනුව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම හා ඉදිරිපත් කිරීම පාලක මණ්ඩලය සතු වගකීමකි.

2.3 ඇගයීම් කිරීමේ පදනම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඓතිහාසික පිරිවැය සම්මුතිය යටතේ උපචිත පදනම මත සකස් කර ඇති අතර උද්ධමන සාධක සඳහා කිසිදු වෙන්කිරීමක් සිදු කර නොමැත.

2.4 ව්‍යවහාර මුදල් ඉදිරිපත් කිරීම හා ක්‍රියාකාරිත්ව

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය ආයතනයේ ක්‍රියාකාරී මුදල් වේ. මූල්‍ය තොරතුරු ශ්‍රී ලංකාවේ රුපියල් වලින් ඉදිරිපත් කෙරේ.

2.5 ප්‍රමාණාත්මක බව, හිලව් කිරීම, වැටයිම් කිරීම

ප්‍රමාණාත්මක බව

සමාන අයිතමයන්හි ප්‍රමාණාත්මක අගයන් මුල්‍ය ප්‍රකාශයන්හි වෙන් වෙන්ව දක්වා ඇත. මුල්‍ය ප්‍රකාශනයන් ඉදිරිපත් කිරීම පිළිබඳ ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 1 මගින් අවසර ලබා දී ඇති පරිදි ප්‍රමාණාත්මක නොවන අයිතමයන් ඒවායේ ස්වරූපය හා ක්‍රියාකාරීත්වයේ අසමානතාවය පදනම් කරගනිමින් වෙන් වෙන්ව මුල්‍ය ප්‍රකාශ දක්වා ඇත.

හිලව් කිරීම

රාජ්‍ය අංශයට ගිණුම්කරණ ප්‍රමිති වලට අවශ්‍ය පරිදි අවසර දී ඇත්නම් මූල්‍ය ප්‍රකාශන වලින් වත්කම් වගකීම් ආදායම් වියදම් හිලව් කිරීම නොකරයි.

වැටයිම් කිරීම

මූල්‍ය ප්‍රකාශන වල ඇති මුදල ආසන්නතම රුපියල් වලට එකතු කර ඇත.

2.6 අඛණ්ඩ පැවැත්ම

කොමිසමේ මූල්‍ය ප්‍රකාශන සකස් කර ඇත්තේ ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පදනම් කරගෙන වේ.

2.7 වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම්

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිත අංක 06 අනුව, වාර්තා කිරීමේ කාලයෙන් පසුව සිදුවීම් යනු වාසිදායක හා අහිතකර සිදුවීම් වන අතර ඒවා වාර්තා කිරීමේ දිනය සහ මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා බලය පවරණ ලද දිනය අතර වේ.

මේ සම්බන්ධයෙන් මෙම වර්ෂය සඳහා වාර්තා කිරීමේ කාලයෙන් පසුව කිසිදු සිදුවීමක් නොමැත.

03. විදේශ මුදල් ගණුදෙනු

ශ්‍රී. ල. රා. අ. ගි. ප්‍ර. 5 අනුව, ආයතනය විසින් විදේශ මුදල් අයිතම එහි ක්‍රියාකාරී මුදල් බවට පරිවර්තනය කරන අතර ඒ අනුව එම පරිවර්තනය වාර්තා කරනු ලැබේ.

04. දේපල හා උපකරණ

4.1 හඳුනා ගැනීමේ පදනම

දේපල හා උපකරණ යනු සේවා සඳහා හෝ පරිපාලනමය අරමුණු සඳහා තබා ඇති ස්පර්ශ අයිතම වන අතර ඒවා වසරකට වැඩි කාලයක් තුල භාවිතා කිරීමට අපේක්ෂා කෙරේ.

4.2 ඇගයීමේ පදනම

වත්කමක් ලෙස පිලිගැනීමට සුදුසුකම් ලබන දේපල හා උපකරණ අයිතමයක් මුලින් මනිනු ලබන්නේ එහි පිරිවැයෙනි. පිරිවැයට වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපනය වන වියදම් සහ එහි කොටසක් එකතු කිරීම හෝ ප්‍රතිස්ථාපනය කිරීම සඳහා වන පිරිවැය ඇතුලත් වේ.

මිලදී ගන්නා ලද අදාල උපකරණ වල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන පරිගණක මෘදුකාංග වැනි දෑ එම උපකරණ වල කොටසක් ලෙස ප්‍රාග්ධනිත කර ඇත.

දේපල හා උපකරණ වල කොටස් වලට විවිධ ප්‍රයෝජනවත් ජීවිත කාලය ඇති වීට, ඒවා දේපල හා උපකරණ වල වෙනම අයිතම (ප්‍රධාන කොටස්) ලෙස ගණන් ගැනේ.

අලුත්වැඩියා කිරීම හා නඩත්තු කිරීම සඳහා විවිධ මූල්‍ය කාලසීමාව තුළ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපනු ලැබේ.

පවත්නා වත්කම් වල මෑතකදී තක්සේරු කරන ලද කාර්යසාධනයේ ප්‍රමිතියට වඩා අනාගත ආර්ථික ප්‍රතිලාභය වැඩි නම් ප්‍රතිසංස්කරණය මගින් හඳුනා ගත හැකි කොටසක් ප්‍රතිස්ථාපනය කරයි.

අදාල වත්කම් වල ඉතිරිව ඇති ප්‍රයෝජනවත් කාලය තුල ප්‍රධාන අලුත්වැඩියාවන් ක්ෂය කරනු ලැබේ.

4.3 ප්‍රත්‍යාගණනය

දේපල ,පිරියත ,උපකරණ යටතේ ඇති වාහන නැමැති වත්කම් පංතිය පමණක් 2021.12.31 දින සිට ප්‍රත්‍යාගණිත අගය මත ගිණුම් තබනු ලබයි. එම වත්කම් පංතිය සාධරණ වටිනාකමට පවත්වාගෙන යන අතර ප්‍රත්‍යාගණන අතිරික්තය ස්කන්ධයට ගලපනු ලබයි.

4.4 හඳුනාගැනීම ඉවත් කිරීම

දේපල ,පිරියත හා උපකරණ අයිතමයක ධාරණ අගය විකුණා බැහැර කිරීමේදී හෝ එය පාවිච්චි කිරීමෙන් හෝ විකුණා බැහැර කිරීමෙන් අනාගත ආර්ථික ප්‍රතිලාභ හෝ සේවා ශක්‍යතා කිසිවක් අපේක්ෂා නොකරන විට, පොත් වලින් ඉවත් කරනු ලැබේ.

මෙම ඉවත් කිරීමෙන් පැන නඟින වාසිය හෝ අවාසිය**"**අනෙකුත් ආදායම්**"**හෝ **"**අනෙකුත් වියදම්**"** යටතේ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයට ගලපනු ලැබේ.

4.5 ක්ෂය

දේපල උපකරණ අයිතම වල එක් එක් කොටස් හි ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය සරල මාර්ග ක්‍රමය යටතේ ක්ෂය කර මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනයේ ක්ෂය වීම් ලෙස දක්වා ඇත.

වත්මන් හා සන්සන්දනාත්මක වසර සඳහා ඇස්තමේන්තු ගත ප්‍රයෝජනවත් ජීවිත කාලය පහත පරිදි වේ.

වත්කම් පන්තිය	**වාර්ෂික අනුපාතය**	**කාලය**
ගෘහ භාණ්ඩ උපකරණ	15%	6 2/3
කාර්යාලයීය උපකරණ	20%	05
මූලාකෘති සැලසුම් සහ නාම පුවරු	10%	10
මෝටර රථ හා වාහන	20%	05
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	20%	05
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	20%	05
කාර්යාලයීය සවිකුරු	15%	6 2/3
තාක්ෂණ බීජෞෂණාගාර යන්ත්‍ර සුත්‍ර හා උපකරණ	20%	05

2014 ජනවාරි 01 වන දින සිට වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සඳහා ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිති 7 භාවිතා කෙරේ.

4.6 සම්පූර්ණයෙන් ක්ෂය කරන ලද දේපල හා උපකරණ

මූල්‍ය තත්වයේ දිනය වන විටත් භාවිතයේ පවතින කොමිසම සතු සම්පූර්ණයෙන් ක්ෂය වූ දේපල හා උපකරණ වල පිරිවැය පහත පරිදි වේ.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2021 (රු.)	2020(රු.)
ගෘහ භාණ්ඩ උපකරණ	861,200	708,582
කාර්යාලයීය උපකරණ	5,490,577	5,487,982
මෝටර රථ හා වාහන	-	16,470,191
ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ කැමරා	1,380,935	1,354,940
රූපවාහිනී සහ වීඩියෝ කැසට් රෙකෝඩර්	941,600	111,750
එකතුව	**8,674,312**	**24,133,445**

4.7 සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලද දේපල හා උපකරණ

කොමිසමේ පහත සඳහන් දේපල හා උපකරණ වාර්තා කරන දිනට සක්‍රීය භාවිතයෙන් ඉවත් කරන ලදී.

දෙසැම්බර් 31 න් අවසන් දිනට	2021 (රු.)	2020 (රු.)
කාර්යාලයීය උපකරණ	19,990	98,887
මුලාකෘති සැලසුම් සහ නාම පුවරු	110,805	110,805
ප්‍රදර්ශන ශාලා	-	37,690
කාර්යාලයීය සවිකුරු	38,000	1,065,682
එකතුව	**168,795**	**1,313,064**

05. විස්තර කරන ලද දායක සැලැස්ම - සේවක අර්ථසාධක අරමුදල හා සේවක භාරකාර අරමුදල

අදාල ප්‍රතිපත්ති හා රෙගුලාසි වලට අනුකූලව සේවකයන්ගේ අර්ථ සාධක අරමුදල් දායකත්වය සහ සේවක භාර අරමුදල් දායකත්වය සඳහා සේවකයින් සුදුසකම් ලබයි.

සේවක අර්ථසාධක අරමුදල කොමිසමෙන් 15% ක් සහ සේවකයන්ගෙන් 10% ක් සේවකයන්ගේ දළ වැටුපෙන් දායක වේ.

සේවකයන්ගේ දළ වැටුපෙන් 3% ක් කොමිසම සේවක භාර අරමුදලට දායක වේ

06.අරමුදල්

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමට රජයේ දායකත්වය, රජයේ වාර්ෂික අයවැය ඇස්තමේන්තුව අනුව අයිතම 02 ක් යටතේ සපයනු ලැබේ.

1. පුනරාවර්ථන වියදම් සඳහා අරමුදල්
2. ප්‍රාග්ධන වියදම් සඳහා අරමුදල්

පුනරාවර්තන ප්‍රදාන ආදායම් හා වියදම් ගිණුමට ගෙන යන අතර ප්‍රාග්ධන ප්‍රදානය ඒ අනුව ගණනය කෙරේ.

කොමිසමේ පුනරාවර්තන වියදම් පහත සඳහන් පරිදි ආදයම් හා වියදම් ගිණුමේ දක්වා ඇත.

1. ආයතන හා පරිපාලන වියදම්

2. පෞද්ගලික චේතන

ප්‍රාග්ධන වියදම් නියෝජනය කරනු ලබන්නේ 1979 අංක 53 දරණ ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන් දිරි ගැන්වීමේ පනතේ අරමුණු සපුරාලීම සඳහා කොමිසම විසින් කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා වන වියදමයි.

07.මුදල් ප්‍රවාහය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ මුදල් ප්‍රවාහ ප්‍රකාශය ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති 02 අනුව වක්‍ර ක්‍රමයට සකස් කර ඇත

08. අරමුදල් එකතු කිරීම/ අනුග්‍රාහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයකින් ලැබෙන පරිත්‍යාග

කොමිසමේ ප්‍රතිපාදා ගිණුම මඟින් පෙන්නුම් කරනුයේ අනුග්‍රහකයින්ගෙන් සහ තෙවන පාර්ශවයන්ගෙන් රැස් කරන ලද අරමුදල් වේ.

		2021 LKR	2020 LKR
1	**මුදල් හා මුදල් සමාන දෑ**		
	මුදල් පොත - 033100101791066	11,925,890	10,965,343
	මුදල් පොත - 033100121791065	-	-
	තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	13,762,138	13,762,138
	IFMSL ව්‍යාපෘතිය	30,495,958	36,472,155
	නව නිපැයුම්කරුවන්ගේ අරමුදල්	4,696,812	4,333,427
	මුදල් පොත - 204402131791066 (විදේශ මුදල්)	1,451,059	1,054,829
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**62,331,856**	**66,587,892**
2	***ණයගැතියෝ***		
	රිෂාන් දුලංජන	174,223	98,336
	S.J.S. අමරසේකර	-	111,115
	C. දසනායක	668,100	502,700
	T.ශක්තිකුමාර්	274,000	328,000
	S. රණසිංහ	298,895	43,262
	සාගරිකා උපමාලි	73,012	2,668
	H.W. වන්ද්‍රනාත්	-	21,344
	උදයසිරි	366,666	66,668
	දිශාන්ත ප්‍රේමනාත්	97,230	-
	නිලන්ත ගුණසිංහ	123,060	-
	සමන් හෙට්ටිආරච්චි	204,012	-
	Other - non performance	9,117,683	9,317,683
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**11,396,880**	10,491,776
3	**නැවත ලැබිය යුතු තැන්පතු**		
	Gavinro Property Developers	2,400,000	2,400,000
	Mobitel (Pvt)Ltd	2,000	2,000
	Express Water System (Pvt) Ltd	5,000	5,000
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**2,407,000**	**2,407,000**
4	**ඉදිරියට කරන ලද ගෙවීම්**		
	ඉදිරියට කරන ලද ගිවිසුම්ගත සේවාවන්	525,453	516,860
	Laptop මිලදී ගැනීම සඳහා ඉදිරියට කරන ලද ගෙවීම්	943,200	-
	ඉදිරියට කරන ලද Sahasak Nimeum වියදම්	-	76,000
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**1,468,653**	**592,860**
5	**අඩමාණ ණයකරුවන් සඳහා 100% වෙන් කිරීම**		
	ජනවාරි 01 දිනට ශේෂය	9,802,964	9,802,964
	වර්ෂය සඳහා වෙන් කිරීම්	-	-
	බොල් ණය	(200,000)	-
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**9,602,964**	**9,802,964**
6	**තොග ඇගයීම (SLPSAS 9)**		
	වර්ෂය අවසානයේ ඇති ලිපි තොග (FIFO) ක්‍රමය පදනම් කරගනිමින් ශ්‍රී. ල. රා. ගි. ප්‍ර. අංක 09 අනුව ගණන් බලන ලදි		
	ලිපි ද්‍රව්‍ය		
	ජනවාරි 01 දිනට ශේෂය	445,954	431,446
	වර්ෂය තුළ මිලදී ගැනීම්	397,200	961,655
	වර්ෂය තුළ වියදම්	(456,295)	(907,855)
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**386,860**	445,954
	ටී - ෂර්ට		
	ජනවාරි 01 දිනට ශේෂය	414,480	415,265
	වර්ෂය තුළ මිලදී ගැනීම්	-	-
	වර්ෂය තුළ වියදම්	-	785
	දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**414,480**	414,480

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්

7 ක්ෂය - ස්ථාවර වත්කම්

	කාර්යාලයීය උපකරණ	ගෘහ භාණ්ඩ උපකරණ	මූලාකෘති සැලසුම් සහ	වාහන Equipment	ප්‍රදර්ශන කුටි	ප්‍රක්ෂේපණ යන්ත්‍ර සහ	රූපවාහිනී සහ වීඩියෝ කැසට්	කාර්යාලයීය සවිකුරු	යන්ත්‍ර සුත්‍ර හා සවිකුරු (තාක්ෂණ බීජෝෂණාගාර)	එකතුව
	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.	රු.
පිරිවැය										-
2020 ජනවාරි 01 දිනට ශේෂය	11,742,457	2,412,224	211,305	16,470,191	37,690	2,264,999	950,300	1,139,502	4,517,802	**39,746,471**
වර්ෂය තුළදී එකතුවීම්	88,315	-	-	-	-	-	-	-	32,960,146	**33,048,461**
වර්ෂය තුළදී අපහරණයන්	(773,390)	-	-	-	-	-	-	-	-	**(773,390)**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**11,057,382**	**2,412,224**	**211,305**	**16,470,191**	**37,690**	**2,264,999**	**950,300**	**1,139,502**	**37,477,948**	**72,021,543**
වර්ෂය තුල මිලදී ගැනීම	757,400	-	-	-	-	-	-	114,355	-	**871,755**
අපහරණයන්	(33,272)	(4,631)	-	-	-	-	-	-	-	**(37,902)**
මාරු කිරීම්	(187,992)	161,997	-	-	-	25,995	-	-	-	**-**
බැහැර කිරීම්	(800,261)	-	-	-	(37,690)	-	(3,900)	(1,027,682)	-	**(1,869,533)**
ප්‍රත්‍යාගණනය	-	-	-	5,029,809	-	-	-	-	-	**5,029,809**
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,793,257**	**2,569,590**	**211,305**	**21,500,000**	**-**	**2,290,994**	**946,400**	**226,175**	**37,477,948**	**76,015,672**
						-			-	
සම්මුචිත ක්ෂය වීම්									-	
2020 ජනවාරි 01 දිනට ශේෂය	9,043,688	1,474,321	161,163	16,470,191	37,690	1,383,975	638,220	545,961	37,639	**29,792,845**
වර්ෂය තුළ ගෙවීම්	1,097,319	255,547	10,050	-	-	193,990	167,710	11,073	5,784,976	**7,520,664**
අපහරණයන්	(770,658)	-	-	-	-	-	-	-	-	**(770,658)**
2020 දෙසැම්බර් 31 දිනට ශේෂය	**9,370,349**	**1,729,868**	**171,213**	**16,470,191**	**37,690**	**1,577,965**	**805,930**	**557,034**	**5,822,614**	**36,542,851**
වර්ෂික ක්ෂයවීම්	1,836,823	256,259	10,050	-	-	182,012	143,497	15,410	7,495,590	9,939,639
අපහරණයන්	(32,142)	(4,631)	-	(16,470,191)	-	-	-	-	-	(16,506,963)
වත්කම් පන්ති අතර මාරු කිරීම	(186,145)	160,150	-	-	-	25,995	-	-	-	0
බැහැර කිරීම්	(794,692)	-	-	-	(37,690)	-	(3,900)	(473,438)	-	(1,309,719)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	**10,194,193**	**2,141,646**	**181,263**	**0**	**-**	**1,785,972**	**945,527**	**99,006**	**13,318,204**	**28,665,808**
ශුද්ධ පොත් අගය									-	
2020 දෙසැම්බර් 31 දිනට	1,687,033	682,356	40,093	0	-	687,034	144,370	582,467	31,655,334	**35,478,692**
2021 දෙසැම්බර් 31 දිනට	**599,064**	**427,944**	**30,042**	**21,500,000**	**-**	**505,022**	**873**	**127,169**	**24,159,744**	**47,349,863**

*** 2021** දෙසැම්බර් **31** දින සිට වාහන වත්කම් සඳහා ප්‍රති තක්සේරු කිරීමේ ආකෘතිය භාවිත කර ඇත. එම වත්කම් වල සාධාරණ වටිනාකමට ගෙන යනු ලැබේ. නැවත තක්සේරු කිරීමේ අතිරික්තය කොටස් වශයෙන් හඳුනාගෙන ඇත. අනෙකුත් වත්කම් ඉතා ඇවර කරන ලද වත්කම් නොවන නිසා ඓතිහාසික පිරිවැය ආකෘතිය යටතේ වටිනාකම් පවතී.

***** නිපුණතා සංවර්ධන, ශාස්ත්‍රීය අධ්‍යාපන, පර්යේෂණ සහ නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යාංශය විසින් **253-2750** අංක දරණ වාහනය **2020** සැප්තැම්බර් **17** දින සිට කොමිසමේ භාවිතය සඳහා මාරු කර ඇත.

8 වෙනත් ගෙවිය යුතු වියදම්

ණයහිමියෝ	1,316,664	167,330
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**1,316,664**	167,330

9 උපචිත වියදම්

ගෙවිය යුතු පිරිසිදු කිරීමේ සහ සනීපාරක්ෂක වියදම්	46,765	56,235
ගෙවිය යුතු ජල ගාස්තු	10,361	13,080
ගෙවිය යුතු විදුලිය ගාස්තු	129,193	105,863
ගෙවිය යුතු දුරකථන ගාස්තු	50,566	58,277
ගෙවිය යුතු ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	200,261	59,165
ගෙවිය යුතු විගණන ගාස්තු	770,500	874,700
ගෙවිය යුතු අතිකාල දීමනා	68,816	189,858
ගෙවිය යුතු කොන්ත්‍රාත්තුමය සේවා සඳහා ගෙවීම්	-	89,050
සහසක් නිමැවුම් ප්‍රදර්ශනය සඳහා ගෙවිය යුතු	4,284	826,784
ගෙවිය යුතුවෙනත් දීමනා	51,500	2,000
ගෙවිය යුතු ගමන් ගාස්තු	2,400	25,987
ගෙවිය යුතු නව නිපැයුම්කරුවන් හා නව නිපැයුම් ප්‍රවර්ධනය	-	46,500
ගෙවිය යුතු ලිපි ද්‍රව්‍ය වියදම්	206,391	-
ගෙවිය යුතු මුද්දර ගාස්තු වියදම්	1,950	3,750
ගෙවිය යුතු පරිපාලන වියදම්	658,986	14,260
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**2,201,973**	2,365,509

10 මහවැලි ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන

ජනවාරි 01 දිනට ශේෂය		
මහවැලි අධිකාරියෙන් ලද ප්‍රතිපදාන	22,079,592	-
<u>ව්‍යාපෘති ක්‍රියාකරකම් සඳහා වූ වියදම්</u>		
නැනෝ විෂන් අනුරාධපුර ආයතනය වෙත කරන ලද ගෙවීම්	(14,159,766)	-
නිෂ්පාදන භාගය	(185,625)	-
අලිවැට ව්‍යාපෘතිය සඳහා කරන ලද පරිපාලන හා සැපයුම් වියදම්	(366,250)	-
ණයහිමියෝ - මහවැලි අධිකාරිය වෙත ගෙවිය යුතු වියදම්	(761,525)	-
ණයහිමියෝ - නැනෝ විෂන් අනුරාධපුර ආයතනය වෙත ගෙවිය යුතු වියදම්	(72,400)	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**6,534,026**	-

11 පාරිතෝෂික

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත යටතේ අදාළ පාරිතෝෂික ගණනය කිරීම් සිදු කර ඇත.		
ජනවාරි 01 දිනට ශේෂය	3,682,614	2,820,257
වර්ෂය සඳහා වෙන් කිරීම්	585,730	862,357
වර්ෂය තුළ පාරිතෝෂික ගෙවීම්	-	-
දෙසැම්බර් 31 න් අවසන් දිනට ශේෂය	**4,268,344**	**3,682,614**

12 IAFM-SL ව්‍යාපෘතිය

ජනවාරි 01 දිනට ශේෂය	36,472,155	46,472,155
වර්ෂය තුල ප්‍රදාන ලැබීම්	-	-
වර්ෂය තුල සිදුකරන ලද වියදම්	-	(10,000,000)
නව නිපැයුම් අරමුදල මණින් මාරු කිරීම	**36,472,155**	36,472,155

13 තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම

ජනවාරි 01 දිනට ශේෂය		45,417,472	51,202,448
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්			
තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම සඳහා වියදම්			
ක්‍රමක් ක්ෂය කිරීම් - රජරට විශ්ව විද්‍යාලය	5	(3,648,242)	(2,716,097)
ක්‍රමක් ක්ෂය කිරීම් - රුහුණු විශ්ව විද්‍යාලය	5	(3,847,348)	(3,068,879)
නව නිපැයුම් අරමුදල මඟින් මාරු කිරීම		**37,921,883**	45,417,472

14 ප්‍රාග්ධන ප්‍රදානයන්

ජනවාරි 01 දිනට ශේෂය		14,334,314	(3,842,092)
වර්ෂය තුල ප්‍රධාන ලැබීම්		7,900,000	24,538,000
ව්‍යාපෘති සඳහා සිදුකරන ලද වියදම්	17	(10,107,926)	(4,355,907)
සේවක ඵලදායකත්වය ගොඩනැංවීම		(533,750)	(270,000)
ස්ථාවර වත්කම් සඳහා වර්ෂික ක්ෂයවීම්	5	(1,686,650)	(1,735,688)
නව නිපැයුම් අරමුදල මඟින් මාරු කිරීම		**9,905,989**	14,334,314

15 නව නිපැයුම්කරුවන්ගේ ණය අරමුදල

ජනවාරි 01 දිනට ශේෂය	13,240,886	8,998,495
IFMSL - ව්‍යාපෘතිය මඟින් ලද ප්‍රදානයන්	-	10,000,000
"COVID 19 වැඩසටහන" යටතේ බෙදාහරින ලද ප්‍රදානයන්	(305,120)	(4,822,043)
නව නිපැයුම් ආකෘතින් සැකසීම වෙනුවෙන් NERD ආයතනය කරන ලද වියදම්	-	(630,000)
කොවිඩ් නව නිපැයුම් ඇගයීම වෙනුවෙන් කරන ලද ගෙවීම	-	(125,000)
නව නිපැයුම් වල තත්ත්ව පරීක්ෂණ වාර්තා වෙනුවෙන් ITI - ආයතනයට ගෙවන ලද වියදම්	(93,582)	(176,040)
නව නිපැයුම් වල තත්ත්ව පරීක්ෂණ වාර්තා වෙනුවෙන් Nano Technology (Pvt) Ltd ආයතනයට ගෙවන ලද වියදම්	(5,000)	(4,526)
නව නිපැයුම් අරමුදල මඟින් මාරු කිරීම	**12,837,184**	13,240,886

16 රාජ්‍ය දායකත්වය

රජයේ දායකත්වය පිළිබඳ සාරාංශයක් පහත දක්වා ඇත.

ශ්‍රී. ලං. ගි. ප්‍ර. 24ට අනුව		
පුනරාවර්තන ප්‍රදාන	40,370,000	40,600,000
ප්‍රාග්ධන ප්‍රදාන	7,900,000	24,538,000
නව නිපැයුම් අරමුදල මඟින් මාරු කිරීම	**48,270,000**	65,138,000

		2021 LKR	2020 LKR
17	**වෙනත් ආදායම්**		
	ආපදා ණය - පොළිය	143,523	112,336
	විදේශ මුදල් - පොළිය	24,984	10,601
	සුළු ආදායම්	13,249	70,694
	විදේශ මුදල් ගණුදෙනු වලින් ඉපයූ ලාභය	96,827	-
	සහසක් නිමැවුම් ලියාපදිංචි ගාස්තු	501,918	1,322,051
	නිෂ්පාදන භාගය	230,218	43,387
	අලිවැට ව්‍යාපෘතිය සඳහා කරන ලද පරිපාලන වියදම්	233,123	-
		1,243,843	**1,559,070**
18	**පුද්ගලික වේතන**		
	වැටුප් සහ වේතන	11,671,645	10,881,623
	ජීවන වියදම් දීමනාව	2,301,000	2,169,028
	වෘත්තිය දීමනා	144,000	131,768
	වෙනත් දීමනා	591,000	565,500
	වැටුප් රහිත නිවාඩු ගාස්තු	-	(2,511)
	සේවා නියුක්තිකයන්ගේ අර්ථ සාධක අරමුදල	2,095,897	1,957,221
	සේවා නියුක්තිකයන්ගේ භාරකාර අරමුදල	419,179	391,444
	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	663,301	406,108
	කොමිසමේ සාමාජිකයින් සඳහා පාරිශ්‍රමිකය ගෙවීම්	1,004,400	660,299
	සේවක ඵලදායකත්වය ගොඩනැංවීම	533,750	270,000
		19,424,172	**17,430,480**
19	**ආයතන හා පරිපාලන වියදම්**		
	දේශීය ගමන් වියදම්	120,464	149,471
	ලිපි ද්‍රව්‍ය	472,407	539,709
	ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය	956,731	582,417
	කාර්යාලයීය උපකරණ - අලුත්වැඩියාව සහ නඩත්තුව	47,100	24,820
	වාහන - අලුත් වැඩියාව සහ නඩත්තුව	2,350,107	923,526
	තැපැල් ගාස්තු	47,900	43,035
	සන්නිවේදන ගාස්තු	736,889	697,679
	උපයෝගි වියදම්	75,491	39,853
	කොන්ත්‍රාත්තුමය වියදම්	1,683,038	1,694,084
	විදුලි ගාස්තු	1,213,047	1,290,361
	පිරිසිදු කිරීමේ වියදම්	469,752	499,913
	ජල ගාස්තු	122,717	84,741
	කුලී වියදම්	13,375,000	14,835,938
	සංග්‍රහ වියදම්	309,020	217,378
	විගණන ගාස්තු	50,000	75,000
	මෙහෙයුම් කල්බදු වියදම්	1,790,550	2,387,400
	වෙනත් පරිපාලන වියදම්	1,190,359	1,068,941
		25,010,573	**25,154,266**
20	**නව නිපැයුම්කරුවන් දිරිගැන්වීමේ වියදම්**		
	මූලික මට්ටමේ පසුවන නව නිපැයුම්කරුවන් හා නව නිපැයුම්කරණය දිරිගැන්වීම	-	61,180
	පළාත් නව නිපැයුම් ප්‍රදර්ශන හා තරඟය	-	922,971
	නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන ප්‍රවර්ධන වැඩසටහන	636,657	904,194
	ජනාධිපති සම්මාන ප්‍රධාන උළෙල	110,111	-
	සහසක් නිමැවුම් ජාතික නව නිපැයුම් ප්‍රදර්ශනය	4,924,909	1,017,820
	දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම	-	557,812
	පේටන්ට් බලපත්‍ර ලබා ගැනීමට නව නිපැයුම්කරුවන්ට සහයවීම	-	37,210
	නව නිපැයුම් සමාජ පිහිටුවීම	2,993,863	-
	SLAAS - FITI - 2020 වැඩසටහන	731,616	509,750
	අලි වැට ව්‍යාපෘතිය	413,379	344,971
	තාක්ෂණ බීජෞෂණාගාර ස්ථාපිත කිරීම	59,545	-
	නව නිපැයුම්කරුවන් ට ආධාර කිරීමේ ණය යෝජනා ක්‍රමය	153,845	-
	නව නිපැයුම්කරුවන් වාණිජකරණය කිරීම	12,000	-
	IAFM-SL ව්‍යාපෘතිය	72,000	-
		10,107,926	**4,355,907**
21	**වෙනත් වියදම්**		
	අපහරණ ලාභ (අනෙකුත් උපකරණ)	560,943	2,732
	විදේශ මුදල් පුරෝකථන ගනුදෙනුවේ පාඩුව	-	5,131
		560,943	**7,863**

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. IMT/D/SLIC/1/21/56 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 මැයි 18 දින

කොමසාරිස්,
ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් තෙතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. **මූල්‍ය ප්‍රකාශන**

1.1 තත්ත්වාගණනය කළ මතය

ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසමේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, කොමිසමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7 හි 65 වගන්තිය අනුව වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවිතකාලය අඩුතරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවද ආයතනය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කර නිබුණ නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.8,674,312 ක් වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 ප්‍රකාරව නැවත සමාලෝචනය කර මූල්‍ය ප්‍රකාශනවල ගැලපීමට කටයුතු කර නොනිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල එකතු වටිනාකම රු. 2,866,966 ක් වූ වර්ග 12කට අයත් උපවිත වියදම් 12 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය හා වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඇ) නව නිපයුම් කව ස්ථාපිත කිරීම වෙනුවෙන් පාසල් 161 ක් වෙත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 30 දිනැතිව ලියන ලද එකතුව රු. 1,610,000 ක් වූ වෙක්පත්වලින් එකතුව රු. 990,000 ක් වූ වෙක්පත් 99 ක් විගණික දිනය වූ 2022 මාර්තු 21 දින වන විටත් අදාළ පාසල් වෙත බෙදා හැරීමෙන් තොරව කොමිසම භාරයේ පැවතුණි. ඒ අනුව නව නිපැයුම් කව කිහිකිරීම වෙනුවෙන් නොදරන ලද රු. 990,000 ක් මූල්‍ය ප්‍රකාශනවල දැක්වීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ වියදම් එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තක්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 කොමිසමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන කොමිසමේ 2021 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ. මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

කොමිසමේ 2021 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම් සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් නිසා, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, කොමිසම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය කොමිසම ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා කොමිසමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

කොමිසමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, කොමිසමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම්

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි

අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් නවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මහහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මහ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් කොමිසමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබෙද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම් යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල වැසුහය හා අන්තර්ගතය සඳහා පෘදක වූ ගනුදෙනු හා සිද්ධීන් උච්ත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම් අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියළු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා කොමිසම පවත්වාගෙන ගොස් නිබුණි.

2.1.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ 1.2(අ) දක්වා ඇති නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට කොමිසම සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ, කොමිසමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

2.2.3 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව කොමිසමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

නව නිපැයුම්කරුවන්ගේ අරමුදලින් ලබා දී තිබූ එකතු වටිනාකම රු. 9,317,683 ක් වූ ණය ශේෂ 12 ක් ඇතුළුව රු. 9,602,964 ක් වන ලැබිය යුතු ණයශේෂ 15 ක් සඳහා සියයට සියක අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර තිබූ අතර එම ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු සතුටුදායක නොවුණි.

ඩබ්ලිව්.පී.සී වික්‍රමරත්න
විගණකාධිපති

2021 විගණන විමසුම් මඟින් පෙන්වා දී ඇති කරුණු නිවැරදි කිරීම සඳහා කළමනාකාරීත්වය සහ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ග

විගණන නිරීක්ෂණය	කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම
1. ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 7හි 65 වගන්තිය අනුව වත්කමක අවශේෂ වටිනාකම හා ප්‍රයෝජනවත් ජීවකාලය අඩු තරමින් සෑම වාර්ෂික වාර්තාකරණ කාල පරිච්ඡේදයක් අවසන් වන දිනයේදී සමාලෝචනය කළ යුතු වුවද ආයතනය විසින් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණ නමුත් දැනටමත් භාවිතා කරනු ලබන පිරිවැය රු.8,674,312 ක් වූ වත්කම්වල ඵලදායී ජීවිත කාලය ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත අංක 03 වටිනාකම රු. 2,866,966 ක් වූ වර්ග 12 කට අයත් උපචිත වියදම් 12 ක් ගිණුම්ගත නොකිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ලාභය එම වටිනාකමින් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.	මෙම වත්කම් කාණ්ඩ යටතේ ඇති භාණ්ඩ හා උපකරණ විවිධ වර්ගයට අයත් බැවින් පොදුවේ ජීවිත කාලය ඇස්තමේන්තු කිරීම ප්‍රයෝගික නොවන බව ද දන්වා සිටිමි. ඒවා තනි තනිව ගත් කල භාණ්ඩ වල ඵලදායී ජීවිත කාල වල ඉහල විචලනාවයක් දැකීමට හැක. එබැවින් ජීව කාල ඇස්තමේන්තු නැවත සංශෝධනය කිරීම ප්‍රායෝගික නොවන බැවින් ශ්‍රී ලංකා රා. අ. ගි. ප්‍ර. අංක 3 හි 45 වගන්ති ප්‍රකාරව මේවා හෙලිදරව් 2022/01/01 දිනට අදාල ලෙජර් ගිණුම් නිවැරදි කර එම නිවැරදි කරන ලද ද්විත්ව සටහනෙහි පිටපතක් ඉදිරිපත් කරමි.
3. නව නිපැයුම් කව ස්ථාපිත කිරීම වෙනුවෙන් පාසල් 161 ක් වෙත සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 30 දිනැතිව ලියන ලද එකතුව රු.1,610,000ක් වූ චෙක්පත්වලින් එකතුව රු. 990,000 ක් වූ චෙක්පත් 99 ක් විගණිත දිනය වූ 2022 මාර්තු 21 දින වන විටත් අදාළ පාසල් වෙත බෙදා හැරීමෙන් තොරව කොමිසම භාරයේ පැවතුණි. ඒ අනුව නව නිපැයුම් කව බිහිකිරීම වෙනුවෙන් නොදරන ලද රු. 990,000	මෙම චෙක්පත් තැන්පත් කිරීමට අදාල අයදුම්පත, ගිණුම් අංකය සමඟ කොමිසම වෙත ඉදිරිපත් කළ යුතු වුව ද රටේ පැවති කොවිඩ් වසංගතය හේතුවෙන් පාසල් වසා තැබීම නිසා එම අයදුම්පත් කොමිසම වෙත ඉදිරිපත් නොවූ බැවින් නැවත එම පාසල් සම්බන්ධීකරණය කර ගනිමින් එම චෙක්පත් ලබා දීමට කටයුතු කරමින් පවතී.

4. වාර්තා කරන දිනට සක්‍රීය භාවිතයෙන් ඉවත් කර තිබූ එකතු වටිනාකම රු. 168,795.00 ක් වූ කාර්යාල උපකරණ නාමපුවරු හා කාර්යාල උපාංග සුදුසු පරිදි අපහරණය කර, මූල්‍ය ප්‍රකාශනවල දේපළ පිරියත උපකරණ වටිනාකමින් ඉවත් කිරීමට	රු. 19,990 ක් වටිනා DVD Player යන්ත්‍රය වැරදීමකින් භාවිතයෙන් ඉවත් කළ වත්කමක් ලෙස සටහන් වී ඇත. එය ඉදිරි මූල්‍ය ප්‍රකාශන වලදී නිවැරදි කිරීමට කටයුතු කරනු ඇත. රු. 110,805 ක් වන නාම පුවරුව 2021 සිදු කරන ලද භාණ්ඩ කර ඇත.
5. නව නිපැයුම්කරුවන්ගේ අරමුදලින් ලබා දී තිබූ එකතු වටිනාකම රු.9,317,683 ක් වූ ණය ශේෂ 12 ක් ඇතුළුව රු. 9,602,964 ක් වන ලැබිය යුතු ණයශේෂ 15 ක් සඳහා සියයට සියක අඩමාණ ණය වෙන් කිරීමක් සිදුකර තිබූ අතර එම ණය ශේෂ අයකර ගැනීමේ කටයුතු සතුටුදායක නොවුණි.	මෙහි සඳහන්ව ඇති ශේෂයන් 2011 සිට ගිණුම් පොත්වල ලැබිය යුතු ශේෂයන් බවට සටහන් වී ඇත. මෙම ශේෂයන් කපා හැරීමට කටයුතු කරන තෙක් පූර්ණ අඩමාණ ණය වෙන් කිරීමක් සිදු කර ඇත.
6. මුදල් ලැබෙන පිළිවෙල අනුව මුදල් පොතේ සටහන් සඳහා අනුක්‍රමික ලෙස අංක යොදා ඒ එකිනෙක සටහන තහවුරු කෙරෙන ලේඛනවලද එම අංකම දැමිය යුතු හා මුදල් පොතේ සටහන්වල දිනය මුදල් භාරගැනීමේ නිලධාරියාගේ කුවිතාන්සි නිකුත් කරනු ලබන දිනය හා සමාන විය යුතු වුවත්	මෙවැනි වැරදි ඉදිරියේදී සිදු නොවීමට වගබලා ගනු ඇත.
7. මුදල් පොතේ සටහන්වලට අනුක්‍රමික අංක යෙදිය යුතු වුවත් කොමිසම විසින් පවත්වාගෙන යනු ලබන මුදල් පොත පරීක්ෂාවේදී එවැනි අනුක්‍රමික අංක පිළිවෙළක් නිරීක්ෂණය නොවුණි.	නිරීක්ෂණය පිලිගනිමි. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි අප විසින් පවත්වා ගෙන යනු ලබන මුදල් පොතෙහි අනුක්‍රමික අංක යෙදීමට කටයුතු කර ඇත.
8. ලැබෙන චෙක්පොත් පිළිබඳ විස්තර සටහන් කිරීමට ලේඛනයක් කොමිසම විසින් නඩත්තු කර නොතිබුණි.	නිරීක්ෂණය පිලිගනිමි. ඔබ විසින් පෙන්වා දී ඇති පරිදි ලැබෙන චෙක්පොත් පිළිබඳ විස්තරයක් 2022 වසරේ සිට නඩත්තු කිරීමට කටයුතු කර ඇත.

9. ලියනු ලබන සෑම චෙක්පතකම උප පත්‍රිකාවෙහි වවුචර අංකය සඳහන් කළ යුතු බවට විධිවිධාන පනවා තිබුණද ඒ සඳහා කොමිසමේ අවධානය යොමු වී නොතිබුණි.	චෙක්පත්හි උප පත්‍රිකාවේ වවුචර අංකය සඳහන් කිරීම සමහර අවස්ථාවලදී මහ හැරී ඇති බව පිළිගන්නා අතර ඉදිරියේ දී එවැනි වැරදි සිදු නොවීමට වගබලා ගනු ඇත.
10. අවශ්‍යතාවය පිළිබඳ අවදානය යොමු කිරීමෙන් තොරව සහසක් නිමැවුම් වැඩසටහන වෙනුවෙන් වර්ෂ 3කට පෙර එනම් 2018 වර්ෂයේදී රු. 998,450 ක වියදමක් මත මුද්‍රණය කරන ලද ටී ෂර්ට් 1270 ක තොගයකින් සමාලෝචිත වර්ෂයේ අවසාන දින වන විටත් රු. 414,480 ක් වටිනා ටී ෂර්ට් 528 ක තොගයක් ඉතිරි වී තිබුණි. මෙම තොගය පිළිබඳ විස්තර ඉන්වෙන්ට්‍රි ලේඛනයෙහි ඇතුළත්ව නොතිබුණි.	අමාත්‍යාංශයෙන් කොමිසම වෙත ලබා දුන් උපදෙස් පරිදි ආයතනයේ නිලධාරියෙකු යටතේ T-Shirt සඳහා වෙනම උප තොග ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර ඔබ විසින් පෙන්වා දුන් පරිදි ප්‍රධාන තොග ලේඛනය තුල ඇතුළත් කිරීමට කටයුතු කර ඇත.
11. නිසි සැලසුමකින් හා අවශ්‍යතාවයකින් තොරව කොමිසම විසින් විවිධ ව්‍යාපෘති හා වියදම් වෙනුවෙන් ලියන ලද චෙක්පත් අදාල ආයතන හා පුද්ගලයන් වෙත භාරදීමෙන් තොරව තබා ගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල එකතුව රු. 743,089.00 ක් වූ චෙක්පත් 40 ක් අහරු වී තිබුණි.	නිරීක්ෂණය පිලිගනිමි. ඔබ විසින් මෙහි සඳහන් කර ඇති ඇතැම් චෙක්පත් මේ වන විට නිරාකරණය කිරීමට කටයුතු කර ඇත. කෙසේ වුවද මෙවැනි කරුණු ඉදිරියේදී වලක්වා ගැනීමට වගබලා ගනු ඇත.
12. 2021 සහසක් නිමැවුම් තරඟාවලියේ ඇඟයීම් කටයුතු 2021 දෙසැම්බර් මස 26 දින අවසන් වී තිබුණු අතර පාසල් අංශයේ ජයග්‍රාහකයින් වෙත 2021 දෙසැම්බර් 30 දින අදාළ මුදල් ත්‍යාගයන් ලබාදී තිබුණි. කෙසේ වුවද, විගණිත දිනය වූ 2022 ජුනි 25 දින වන විට තරඟය අවසන් වී දින 176 ක් ගත වී තිබුණද පාසල් අංශය ඇතුළු අනෙකුත් අංශවල ජයග්‍රාහකයින් වෙත සහතිකපත් සහ වර්ණ ප්‍රදානයන් සිදුකර නොතිබුණි.	එම ත්‍යාග ප්‍රදානෝත්සවය 2022 වර්ෂයේදී පැවැත්වීමට අදාල මූල්‍ය ප්‍රතිපාදන භාණ්ඩාගාරය මඟින් කොමිසම වෙත ලබා දී තිබුණේ 2022 මාර්තු මස 31 දින වන අතර ඒ සමඟ බලපැවැත්වූ රාජ්‍ය අයවැය චක්‍රලේඛ 03/2022 අනුව එම කාර්යයන් තාවකාලිකව අත්හිටුවා ඇතිබැවින් ඊට අවශ්‍ය ඉදිරි ප්‍රසම්පාදන කටයුතු හෝ උත්සව කටයුතු සංවිධානය සිදුකිරීම් තාවකාලිකව අත්හිටුවීමට සිදු වී ඇත.
13. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ නවෝත්පාදන වැඩි කිරීමේ හා එම නවෝත්පාදන කඩිනමින් රටේ ආර්ථිකයට හා සමාජයට එක් කිරීමේ අරමුණින් යුතුව පවත්වාගෙන යන	ගිවිසුම් ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු බිල්පත් හා අනෙකුත් ලියවිලි ගෙන්වා ගැනීම සඳහා ලිපි යවා ඇති අතර රැස්වීමක්ද පවත්වා ඇත.

නවෝත්පාදන කඩිනම් කරවීමේ අරමුදල (IAFM) මගින් 2008 හා 2009 වර්ෂයන්හිදී ඒ සංජීව සමරවික්‍රම යන අය වෙත ප්‍රදානයක් ලෙස ලබා දෙන ලද එකතුව රු. 3,187,500 ක මුදල සම්බන්ධයෙන් ගිවිසුම් ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු බිල්පත් හා අනෙකුත් ලියවිලි විගණිත දිනය වූ 2022 ජූලි 25 දින වන විටත් කොමිසම වෙත ලැබී නොතිබුණි.	
14. සමාලෝචිත වර්ෂයේදී පමණක් රු. මිලියන 22 කට අධිකව අදියර කිහිපයකින් දියත් කරන ලද මෙම ව්‍යාපෘතිය නැනෝ විෂන් අනුරාධපුරය (පුද්) සමාගම වෙතින් ඉටුකරවා ගෙන තිබූ අතර මෙම සැපයුම්කරු තෝරා ගැනීමේදී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ විධිවිධානයන්ගෙන් පරිබාහිරව කටයුතු කර තිබුණි.	ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක්ව මහවැලි කලාප තුල ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අවශ්‍යතාවය මත පදනම්ව මිනිසුන් හා වනජීවීන් අතර ගැටුම් අවම කිරීමේ අරමුණින් නියමු ව්‍යාපෘති කිහිපයක් ක්‍රියාත්මක කර ඇත. මෙම නියමු ව්‍යාපෘති සඳහා අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුම (05 ඇමුණුම)අනුව කොමිසම විසින් සුදුසු නව නිපැයුම්කරුවන් වෙත පහසුකම් සැපයීම සිදුකරන ලද අතර නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම අපගේ කාර්යය භාරයක් වන හෙයින් නව නිපැයුම්කරුවන් වෙත නව වෙළෙඳපළ සොයාදීම සඳහා මෙම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ලදී. ශ්‍රී ලංකා නව නිපැයුම්කරුවන්ගේ කොමිසම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය එක්ව අත්සන් කරන ලද අවබෝධතා ගිවිසුමෙහි දෙවෙනි කොටසෙහි අවසන් කරුණ මගින් දක්වා ඇති ආකාරයට මෙම නියමු ව්‍යාපෘති සඳහා අවශ්‍ය උපකරණ වෙනුවෙන් වන සියලුම ප්‍රසම්පාදන කටයුතු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය විසින් සිදුකල යුතුය.අප කොමිසම හරහා නියමු ව්‍යාපෘති සඳහා අවශ්‍ය වන උපාංග ප්‍රමාණයන් සහ ඒවායේ ඇස්තමේන්තුවක් යොමුකිරීම පමණක් සිදුකර ඇත.

15. විගණනය විසින් ජාතික බුද්ධිමය දේපළ කාර්යාලයෙන් කරන ලද විමසීම් අනුව මිනිසුන් හා වනජීවීන් අතර ඇතිවන ගැටුම් අවම කිරීම වෙනුවෙන් දේශීය පේටන්ට් බලපත්‍රලාභීන් සිව් දෙනෙකු වූ අතර ඔවුන් සමඟ සිදුකරන ලද සාකච්ඡාවන්වලදී ඉහත ව්‍යාපෘතිය සම්බන්ධයෙන් ඔවුන්ව දැනුවත් කර නොතිබුණු බව ප්‍රකාශ විය. පේටන්ට් බලපත්‍රලාභීන් වෙත අවධානය යොමු කිරීමෙන් තොරව කොමිසම විසින් සාමාන්‍ය පුද්ගලයෙකු වෙත මෙම කොන්ත්‍රාත්තුව පිරිනැමීම ජාතික වගකීමක් පැහැර හැරීමක් ලෙස විගණනයේදී නිරීක්ෂණය විය.	පේටන්ට් බලපත්‍ර ලැයිස්තුවේ සඳහන් නව නිපැයුම් 04 න් 02කම නව නිපැයුම්කරුවන් (පේටන්ට් බලපත්‍ර අංක 17895 සහ 18814) වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාත්මක කල නියමු ව්‍යාපෘති පිළිබඳව දැනුවත් කර ඇත. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ ක්‍රියාත්මක කරන ලද වාණිජකරණ අදියරයන් හි දී එම වාණිජකරණ අදියරයන් පිළිබඳව දැනුවත් කරන ලද්දේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාත්මක කල නියමු ව්‍යාපෘතියේ සාර්ථකත්වයක් පෙන්නුම් කරන ලද නව නිපැයුම් පමණි. පේටන්ට් අංක 15277 සහ 17772 දරන අනෙක් නව නිපැයුම් ද්විත්වය, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාත්මක පළමු නියමු ව්‍යාපෘතියට සහභාගී කරගැනීමට නොහැකිවීම පිළිබඳව ඔබගේ නිරීක්ෂණය පිලිගනිමි. කෙසේ වෙතත් එම නව නිපැයුම් 04 න් එකදු නව නිපැයුමක්වත් විද්‍යුත් බලගැන්වුම් පද්ධතියක් නොවූ අතර එම හේතුවෙන් එම නව නිපැයුම් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘති සඳහා යොදා ගැනීමට හැකියාවක් නොපැවතිණ. ශ්‍රී ලංකාවේ 2020 වර්ෂයේ නිකුත් කරන ලද පේටන්ට් බලපත්‍ර පිළිබඳව සලකන විට එක් පේටන්ට් බලපත්‍රයක් නිකුත් කිරීම සඳහා ගතව ඇති මධ්‍යන්‍යය කාලය අවුරුදු 03යි මාස 06කි. එබැවින් අප කොමිසම විසින් පේටන්ට් බලපත්‍රය අයදුම්කර ඇති නව නිපැයුම් සඳහාද මූල්‍ය සහ තාක්ෂණික සහයෝගය ලබා දෙනු ලබයි. කොමිසම එලෙස මූල්‍ය ආධාර ලබාදුන් නව නිපැයුම් අතුරින් ඇතැම් නව නිපැයුම් මේ වන විට ඉතාමත්ම සාර්ථක ලෙස වෙළඳපොළ ජයගෙන සාර්ථක වාණිජකරණ ගමනක නියැලෙමින් පවතී. එබැවින් "වන අලින්ගේ සංචරණ හඳුනාගැනීම සඳහා අවශ්‍ය රේඩියෝ කරපටි" සහ "බහුකාර්ය විද්‍යුත් එනජයිසරය" නම් නව නිපැයුම් ඒ වන විට පේටන්ට් බලපත්‍රය අයදුම්කර පැවති හෙයින් සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාත්මක පළමු නියමු ව්‍යාපෘතියේදී යම් ප්‍රගතියක් අත්කරගත් නව නිපැයුම් වීම හේතුවෙන් කොමිසමේ ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුව එම නව නිපැයුම්කරුවන් වෙත නව වෙළෙඳපළ සොයාදීම සඳහා කටයුතු කරන ලදී.

	නමුත් මේ වන විට ජී. ඩී. කේ. සමරනායක නව නිපැයුම්කරු අයදුම්කරන ලද පේටන්ට් බලපත්‍රය ප්‍රතික්ෂේප කර ඇති බව ජාතික බුද්ධිමය දේපළ කාර්යාලය විසින් ඔහු වෙත දන්වා යවා ඇත.
16. තවද පේටන්ට් බලපත්‍රලාභියෙකු විසින් 2020 ඔක්තෝබර් 23 දිනැතිව මහවැලි කලාප ආරක්ෂක ඇලවේලි සහ ජනාවාස පොදු යටිතල පහසුකම් සංවර්ධන රාජ්‍ය අමාත්‍යාංශ ලේකම් අමතා මෙම ඉදිකිරීම් සම්බන්ධයෙන් විරෝධතාවය පළකර තිබුණු අතර මේ සම්බන්ධ කරුණු සොයා බලා වාර්තා කරන ලෙස ශ්‍රී ලංකා මහවැලි අධිකාරියේ අධ්‍යක්ෂ විසින් කොමිසම දැනුවත් කර තිබුණද, ඒ සම්බන්ධයෙන් කොමිසමෙහි අවධානය යොමු වී නොතිබුණි.	2021 පෙබරවාරි 18 දිනැති අංක MASL/D/RDSP/03/03 දරන මහවැලි අධිකාරිය වෙතින් යොමුකරන ලද ලිපිය සඳහා කොමිසමේ අවධානය යොමුකරන ලදී. එහෙත් එමඟින් දන්වා එවූ පරිදි එව්. කේ. සරත් ගාමිණී නමැති නව නිපැයුම්කරු විරුද්ධත්වය දක්වා තිබුයේ ඔහුගේ අනුදැනුමකින් තොරව ඔහුගේ පේටන්ට් අංක 18814 දරන නව නිපැයුම භාවිතයට එරෙහිව පමණක් වන අතර එය අප කොමිසම සහ ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ ක්‍රියාත්මක කරන ලද නියමු ව්‍යාපෘති සඳහා වූ විරුද්ධත්වයක් නොවන බව මෙනෙහි කරනු කැමැත්තෙමි. කෙසේ වෙතත් ඔහුගේ නව නිපැයුම ඔහු විසින් පවසන පරිදි මහවැලි අධිකාරිය සමඟ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘතීන් සඳහා අප කොමිසම භාවිතා නොකළ හෙයින් ඔහුගේ චෝදනාව අප කොමිසම වෙත කරන ලද්දක් නොවන අතර ඔහු මහවැලි අධිකාරිය වෙත යොමුකරන ලද ලිපිය 2020.10.23 දිනැතිව යොමුකරන ලද්දක් වන අතර ඒ වන විට මහවැලි අධිකාරිය සමඟ අප කොමිසම මූලික අදියරේ සාකච්ඡා කිහිපයක් පමණක් පවත්වා තිබූ වකවානුවක්ද වීය. එබැවින් මෙය අප කොමිසම විසින් කිසිසේත්ම නොකරන ලද කරුණක් වීය.
17. තවද, නව නිපැයුම්කරුවන්ගේ නව නිපැයුම් ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි අලෙවි කිරීම සඳහා නව නිපැයුම්කරුවන්ට උපකාර කිරීම මිස ඒ තුළින් අදායම් ඉපයීම කොමිසමෙහි අරමුණු අතර නොවුණත් මෙම ව්‍යාපෘතිය තුළින් කොමිසම විසින් සියයට 30ක නිෂ්පාදන භාරයක් කොන්ත්‍රාත්කරුවන්ගෙන් අයකර ගෙන තිබුණි. ඒ අනුව කොන්ත්‍රාත්කරු විසින් ඇස්තමේන්තු පිළියෙළ කිරීමේදී කොමිසම වෙත ගෙවිය යුතු මෙම සියයට 30 ක කොමිස් මුදලද ඇතුලත්ව තිබීම හේතුවෙන්	කොමිසම විසින් කලින් කලට ගනු ලබන ප්‍රතිපත්තිමය තීරණයන්ට අනුව නව නිපයුම්කරුවකුට සිය නව නිපැයුම් වාණිජකරණය සඳහා සහයෝගය ලබාදීමෙන් අනතුරුව, එම නව නිපැයුම වාණිජකරණය කිරීම හරහා නව නිපැයුම්කරුවන් වෙතින් නිෂ්පාදන භාගයක් අයකර ගැනීමට කොමිසම කටයුතුකරනු ලබයි. එම නිෂ්පාදන භාගය මඟින් උත්පාදනය කරනු ලබන අදායම තවත් නව නිපැයුම්කරුවකු සඳහා අවශ්‍ය සහයෝගයන් ලබාදීම සඳහා යෙදවීම කොමිසමේ අපේක්ෂාව වේ. එමෙන්ම මේ වන තෙක් නිෂ්පාදන භාගයන් තුලින් උත්පාදනය කරන ලද මුදල්, ආයතනීය කිසිදු පුනරාවර්තන වියදමක් වෙනුවෙන්

රජයට අනවශ්‍ය වැය බරක් දැරීමට සිදුවී තිබුණි.	භාවිතා කර නොමැත. මෙම නිෂ්පාදන භාගයක් අයකර ගැනීම ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සිදුකරන ලද ව්‍යාපෘති සඳහා පමණක් නොව මූල්‍යාධාර ලබාදීමේ වැඩසටහන් හරහාද මෙම නිෂ්පාදන භාගයක් අයකර ගැනීමට කොමිසම කටයුතුකරනු ලබයි.
18. තවද, මෙම විෂයෙහි පේටන්ට් බලපත්‍රලාභියෙකු නොවූ තෝරාගත් සමාගම ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි කර තිබුණේ 2021 ජනවාරි මස 05 වන දින දීය. ඒ අනුව මෙම ව්‍යාපෘතිය සඳහා මෙම ආයතනය තෝරා ගන්නා අවස්ථාවේදී මෙන්ම 2020 දෙසැම්බර් 23 වන දින ක්ෂේත්‍ර පරීක්ෂාවේ යෙදෙන අවස්ථාවේදී ද මෙම ආයතනය ව්‍යාපාරයක් ලෙස ලියාපදිංචි වී නොතිබුණි.	ජී. ඩී. කේ. සමරනායක නව නිපැයුම්කරුගේ "බහුකාර්ය විද්‍යුත් එනජයිසරය" නමැති නව නිපැයුම පේටන්ට් බලපත්‍රය ලබාගෙන නොතිබුණද අදාල කාල වකවානුව වන විට ඔහු ඒ සඳහා පේටන්ට් බලපත්‍රය සඳහා අයදුම් කර තිබිණ. ඉහත හතර වන කරුණ යටතේ දැක් වූ පරිදි පේටන්ට් බලපත්‍රය අයදුම් කරන ලද නව නිපැයුම් සඳහා ද කොමිසම තම රාමුව තුල අදාල සහයෝගය දක්වනු ලබයි. එමෙන්ම මෙම නව නිපැයුම්කරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ ක්‍රියාත්මක කල නියමු ව්‍යාපෘතියට සහභාගී වන අවස්ථාවේ දී පවා සිය නව නිපැයුම "නැනෝ විෂන්" නාමයෙන් නම් කර පැවති අතර ඔහුගේ නව නිපැයුම භාවිතයෙන් ආරම්භක ව්‍යාපාරයක් ආරම්භ කිරීමට පාලක මණ්ඩලය අනුමැතිය ලැබෙනුයේ 2020.12.22 දින පාලක මණ්ඩල රැස්වීමේදීය. ඔහු සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ තම ආරම්භක ව්‍යාපාරය ලියාපදිංචි කර ඇත්තේ ඉන් පසුව වන නමුත් ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සමඟ නියමු ව්‍යාපෘතිය සඳහා ගිවිසුම් ගත වීමට පෙර ඔහු විසින් සිය ව්‍යාපාරය සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇත. "වන අලින්ගේ සංචරණ හඳුනාගැනීම සඳහා අවශ්‍ය රේඩියෝ කරපටි" සහ "බහුකාර්ය විද්‍යුත් එනජයිසරය" යන නව නිපැයුම් ද්විත්වයම සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ ලියාපදිංචිය සඳහා මෙන්ම අවශ්‍ය වූ ආයතන රාමුව තුල ඉටුකළ හැකි සහයෝගයන් සහ මාර්ගෝපදේශයන් එම නව නිපැයුම් සඳහා කොමිසම ලබා දී ඇත.